එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව
කොන්සියුලර් කටයුතු කාර්යාංශය

2014 වර්ෂයේ විවිධත්ව සංක්‍රමණික වීසා වැඩසටහන සඳහා උපදෙස් - DV 2014

එක්සත් ජනපද නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් බලය පවරනු ලැබූ විවිධත්ව සංක්‍රමණික වීසා වැඩ සටහන රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික පදනමකින් ක්‍රියාත්මක කරනු ලබන්නේ සංක්‍රමණ හා ජාතිකත්ව පනතේ INA 203 (ඇ) වගන්තිය යටතේය. මෙම නීතිය යටතේ විවිධත්ව සංක්‍රමණිකයන් ලෙස හඳුන්ව ලබන සංක්‍රමණිකයන් ලෙස, පසුගිය කාලවල එක්සත් ජනපදයට අඩු සංක්‍රමණිකයන් ප්‍රමාණයක් පැමිණ ඇති රටවල පුද්ගලයන්ට වීසා නිකුත් කෙරේ. 2014 මුදල් වර්ෂය සඳහා විවිධත්ව වීසා (DV) 50,000 ලබාගත හැකිවේ.

මෙම වාර්ෂික DV වැඩසටහන යටතේ සරල වුවද, දැඩි යෝග්‍යතා අවශ්‍යතාවන් සපුරාලන, පුද්ගලයන්ට වීසා ලබා දෙනු ඇත.. පරිගණකයෙන් මෙහෙයවන අහඹු ලොතරැයි ඇදීමකින් විවිධත්ව වීසා සඳහා පුද්ගලයන් තෝරා ගනු ලැබේ. මෙම වීසා භූගෝලීය ප්‍රදේශ හයක් අතර බෙදා දෙන අතර, එක් එක් කලාපය තුල කිසිම රටකට එම වර්ෂය තුල ලබාදෙන විවිධත්ව වීසාවලින් සියයට 7කට වඩා නොලැබේ. ඓතිහාසික ව එක්සත් ජනපදයට අඩු ප්‍රමාණයකින් සංක්‍රමණිකයන් එවන රටවල පුරවැසියන්ට මෙම වීසා ලබා දේ. පසුගිය අවුරුදු පහ තුල එක්සත් ජනපදයට 50,000කට වැඩියෙන් සංක්‍රමණිකයන් පැමිණ ඇති රටවල වැසියන්, විවිධත්ව වීසා සඳහා අයැදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

පසුගිය අවුරුදු පහ තුල මෙම රට වලින් එක්සත් ජනපදයට 50,000කට වැඩියෙන් සංක්‍රමණිකයන් පැමිණි ඇති බැවින්, පහත සඳහන් රටවල[1] වැසියන්, DV-2014 සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

> **බංගලාදේශය, බ්‍රසීලය, කැනඩාව, චීනය (ප්‍රධාන දේශයෙහි උපන්) කොළම්බියාව, ඩොමිනිකන් සමූහාණ්ඩුව, ඉක්වදෝරය, එල්සැල්වදෝරය, හයිටි, ඉන්දියාව, ජැමෙයිකාව, මැක්සිකෝව, පකිස්තානය, පේරු, පිලිපීනය, දකුණු කොරියාව, එක්සත් රාජධානිය (උතුරු අයර්ලන්තය හැර) සහ එහි යටත් ප්‍රදේශ හා වියට්නාමය.**
>
> හොංකොං (විශේෂ පරිපාලන කලාපය) මකාවු (විශේෂ පරිපාලන කලාපය) හා තායිවානයේ උපන් අය සුදුසුකම් ලබයි.

මෙම වර්ෂයේ සුදුසුකම් පිළිබඳ වෙනස්කම්:

DV-2014 සඳහා ගෝතමාලාවේ වැසියන් තෝරාගැනීම සඳහා දැන් සුදුසුකම් ලබ.

රාජ්‍ය දෙපාර්තමේන්තුව, විවිධත්ව වීසා ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම හා ආරක්ෂා සහිතව පවත්වා ගෙන යාම පිණිස DV-2005 ආරම්භයේ සිට ඉලෙක්ට්‍රොනික ලියාපදිංචි කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කළේය. නීති විරෝධී ලෙස සංක්‍රමණය වීමේ අරමුණෙන් වංචනික ක්‍රියාවන්හි නිරත වන්නන් හෝ බහු අයදුම්පත් ඉදිරිපත් කරන්නවුන් හඳුනා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විශේෂ තාක්ෂණයක් හා වෙනත් ක්‍රම උපයෝගී කර ගනී.

[1] මෙම දැන්වීමෙහි "රට" යන පදයට රටවල්, අර්ථ ක්‍රම හා වෙනත් අධිකරණ බලසීමා අයිතිවන අතර, ඒවා මෙම උපදෙස් අවසානයේ පැහැදිලිව ලැයිස්තුගත කර ඇත.

විවිධත්ව වීසා සඳහා ලියාපදිංචි වීමේ කාලසීමාව

DV-2014 විවිධත්ව වීසා ලොතරැයිය සඳහා අයදුම්පත් 2012 ඔක්තෝබර් 02 වැනි අඟහරුවාදා නැගෙනහිර දිවාකාල මධ්‍යාහ්නයේ (EDT) (GMT -4) සිට 2012 නොවැම්බර් 03 වැනි සෙනසුරාදා නැගෙනහිර දිවාකාල වේලාවෙන් මධ්‍යාහ්නය (EDT) (GMT-4) දක්වා අතර කාලයේදී ඉලෙක්ට්‍රොනිකව ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරුවන්ට ලියාපදිංචි කිරීමේ කාලය තුල www.dvlottery.state.gov වෙබ් අඩවියෙන් ඉලෙක්ට්‍රොනික විවිධත්ව වීසා අයදුම්පතට (E-DV) ප්‍රවේශ විය හැකිය. කඩදාසිවල ලියූ අයදුම්පත් බාරගනු නොලැබේ. අයදුම්පත් ඉදිරිපත් කිරීමට ලියාපදිංචි කිරීමේ කාලසීමාවේ අවසාන සතිය තෙක් පමා නොකරන ලෙස අයදුම්කරුවන්ට තරයේ අවවාද කරනු ලැබේ. දැඩි ඉල්ලුම නිසා වෙබ් අඩවියෙහි ප්‍රමාද වීම් ඇති විය හැකිය. 2012 නොවැම්බර් 03 වැනි දින (EDT) මධ්‍යාහ්නයෙන් පසුව කිසිම අයදුම්පතක් බාර නොගැනේ.

ඇතුළත්වීම සඳහා අවශ්‍යතා

- DV ලොතරැයියට ඇතුළත් වීම සඳහා ඔබ ලැයිස්තු ගත කරන ලද රටක වැසියකු විය යුතුය.

  සුදුසුකම් ලබන වැසියන් සඳහා කලාප අනුව රටවල් ලැයිස්තුව බලන්න.

  සුදුසුකම් ලබන රටක වැසියන්: බොහෝ විට මෙයින් අදහස් කෙරෙන්නේ ඔබ උපන් රටය. කෙසේ වුවත්, ඔබට සුදුසුකම් ලැබිය හැකි වෙනත් මාර්ග දෙකක් තිබේ. පළමුවැනි ක්‍රමය වන්නේ, ඔබ උපන් රට සුදුසුකම් නොලබන රටක් වුවද, ඔබගේ කලත්‍රයා ඉපිද ඇත්තේ වැසියන් සුදුසුකම් ලබන රටක නම්, ඔබට ඔබගේ කලත්‍රයාගේ උපන් රට යටතේ ඉල්ලුම් කළහැකි වීමයි. මෙසේ කළ හැකි වන්නේ දෙදෙනාම තේරී, වීසා නිකුත් කළ විට, දෙදෙනාම එක්වර එක්සත් ජනපදයට ඇතුළු වන්නේ නම් පමණි. දෙවැනි ක්‍රමය වන්නේ, ඔබ උපන් රට, එහි වැසියන් සුදුසුකම් නොලබන රටක් වුවත්, ඔබගේ දෙමාපියන්ගෙන් එක් අයකුවත් එහි ඉපදී නැත්නම් හෝ ඔබ උපදින අවස්ථාවේදි එහි පදිංචිව නොසිටියේ නම්, දෙමාපියන් උපන් රටවලින් එකක ජාතිකත්වයට ඔබට හිමිකම් කිව හැකිය. එසේ කළ හැක්කේ ඔබ හිමිකම් කියන රටෙහි වැසියන් DV-2014 වැඩසටහන සඳහා සුදුසුකම් ලබන්නේ නම් පමණි

- **ලොතරැයියට ඇතුල්වීමට, DV වැඩසටහනේ අධ්‍යාපන සුදුසුකම් හෝ වැඩ පළපුරුදු සුදුසුකම් සපුරාලිය යුතුය:** ඔබ මූලික හා ද්විතීයික අධ්‍යාපනය පිළිබඳ වර්ෂ 12ක පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර ඇති බවට අර්ථ දක්වන උසස් පාඨශාලා අධ්‍යාපනයක් හෝ ඊට සමාන අධ්‍යාපනයක් ලබා තිබිය යුතුය; එසේ නැතහොත් වසර 02 පුහුණුවක් හෝ වැඩ පළපුරුද්ද අවශ්‍ය වන රැකියාවක පසුගිය වර්ෂ 05 තුළ අවුරුදු 02 ක වත් පළපුරුද්දක් ලබා තිබිය යුතුය. සුදුසුකම් ලබන වැඩ පළපුරුද්ද නිර්ණය කිරීම සඳහා එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව O*NetOnLine දත්ත සමුදාය යොදා ගනු ඇත. ප්‍රධාන අයදුම්කරුගේ සුදුසුකම් ලබන වැඩ පළපුරුද්ද පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා නිති අසන පැන #13 බලන්න

  මෙම අවශ්‍යතා එකක් වත් ඔබට සපුරාලිය නොහැකි නම් ඔබ මෙම (DV) වැඩසටහන යටතේ ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් **නොකල** යුතුය.

DV-2014 සඳහා අයදුම්පතක් ඉදිරිපත් කිරීමේ කාර්ය පටිපාටි :

- රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් බාරගනු ලබන්නේ ලියාපදිංචි කිරීමේ කාලය වන 2012 ඔක්තෝබර් 02 වැනි අඟහරුවාදා මධ්‍යාහ්නයේ (EDT) (GMT-4) සිට 2012 නොවැම්බර් 03 වැනි සෙනසුරාදා මධ්‍යාහ්නය (EDT) (GMT-4) දක්වා කාලය තුළදී www.dvlottery.state.gov වෙත ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් ඉදිරිපත් කරනු ලබන සම්පූර්ණ කළ ඉලෙක්ට්‍රොනික විවිධත්ව වීසා (E-DV) ඇතුළත්වීමේ පෝරම පමණක් වේ.

- යම්කිසි පුද්ගලයෙක් වෙනුවෙන් අයදුම්පත් එකකට වැඩි ප්‍රමාණයක් ඉදිරිපත්කර ඇත්නම් ඒවා ඉදිරිපත් කළේ කවුද යන්න නොසලකා ඔහු නුසුදුස්සකු කරනු ලැබේ. ඔබගේ අයදුම්පත් ඔබම සකසා ඉදිරිපත් කිරීමට හෝ වෙනත් අයකු ලවා ඉදිරිපත් කරවීමට පුලුවන. මෙම (DV) වැඩසටහනේ *ලියාපදිංචිවීමේ **ගාස්තුවක් හෝ පිරිවැයක්** නැත.*

- අයදුම්පත් ලියාපදිංචිය සාර්ථක නම් ඔබගේ නම හා සුවිශේෂී තහවුරු අංකයක් සහිත තහවුරු කිරීමේ තිරයක් දිස්වෙනු ඇත. ඔබගේ වෙබ් බ්‍රවුසරයේ මුද්‍රණ කාර්යය යොදා ගෙන ඔබගේ වාර්තා සඳහා මෙම තහවුරු තිරය මුද්‍රණය කර ගත යුතු අතර, මෙම ඔබේ තහවුරු අංකය ඔබ ලහ තබාගැනීමට වග බලා ගත යුතුය. **2013 මැයි 01 වනදා සිට මෙම වෙබ් අඩවියට (www.dvlottery.state.gov) ඔබේ සුවිශේෂී තහවුරු අංකය හා අනිකුත් පුද්ගලික තොරතුරු ඇතුල් කිරීමෙන් ඔබේ DV-2013 ඉල්ලුම්පත්‍රය පිළිබඳ තත්වය දැනගත හැකිවේ. ඔබ DV-2014 සඳහා තේරී ඇත්දැයි දැනුම් දීම, ඔබ ඉල්ලුම් පත පිළිබඳව ක්‍රියාකළ යුතු ආකාරය ගැන උපදෙස් දීම, ඔබේ සංක්‍රමණික වීසා සම්මුඛ පරීක්ෂණය පිළිබඳව දැන්වීම ආදි සියල්ල දැනුම්දීම සඳහා එකම ක්‍රමය වන්නේ ප්‍රවේශ තත්ව පරීක්ෂාවයි. මේ නිසා ඔබේ තහවුරු අංකය තබාගැනීම අත්‍යාවශ්‍ය වේ.**

- කඩදාසිවල ලියන ලද අයදුම්පත් තව දුරටත් බාර ගනු නොලැබේ. 2014 විවිධත්ව වීසා වැඩසටහනට ඇතුල් විය හැකි එකම ක්‍රමය ඉලෙක්ට්‍රොනික ක්‍රියාවලියයි.

- ඔවුන් අයදුම්කරු සමග ජීවත් වන්නේද නැත්ද යන්න හෝ අයදුම්කරු එක්සත් ජනපදයට සංක්‍රමණය වුවහොත් ඔහු සමඟ එන්නේද නැතහොත් පසුව පැමිණෙන්නේද යනාදිය ගැන නොසලකා **ඔබේ අයදුම්පතේ, ඔබේ කලත්‍රයා (සැමියා හෝ බිරිඳ) හා වයස 21ට අඩු සියළුම අවිවාහක ළමයින් ලැයිස්තු ගත කළ යුතුය.** දැනටමත් එක්සත් ජනපදයේ පුරවැසියකු වන හෝ නීත්‍යානුකූල ස්ථිර පදිංචිය ඇති කලත්‍රයා හෝ දරුවකුට DV වීසා අවශ්‍ය නොවන අතර, එවැන්නක් නිකුත් නොකරනු ඇත. මෙම උපදෙස්වලට අනුකූලව කටයුතු කිරීමට අසමත්වීම නිසා ඔබේ අයැදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත.

- **අවශ්‍ය සියලු ඡායාරූප ඉදිරිපත් කිරීම ඉතා වැදගත්ය.** අවශ්‍ය සියලුම ඡායාරූප ඉදිරිපත් නොකළහොත් ඔබගේ අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. ඉලෙක්ට්‍රොනික විවිධත්ව වීසා අයදුම්පත්‍රය සමග පහත සඳහන් පුද්ගලයන්ගේ මෑතදී ගත් ඡායාරූප, අයදුම්පත් පෝරමය සමග ඉලෙක්ට්‍රොනිකව ඉදිරිපත් කළ යුතුය.
  - ඔබ,
  - ඔබගේ කලත්‍රයා,
  - ඔබ ඉලෙක්ට්‍රොනික් අයදුම්පත ඉදිරිපත්කරන අවස්ථාවේ අවුරුදු 21ට අඩු ස්වාභාවික දරුවන් මෙන් ම නීත්‍යානුකූලව හදාවඩා ගත් දරුවන් සහ සුළු දරුවන් ඇතුලු සෑම දරුවකුගේම ඡායාරූප. එම දරුවන් තවදුරටත් ඔබ සමග ජීවත් නොවුවත්, DV වැඩසටහන යටතේ එම දරුවන් සංක්‍රමණය වීමට අපේක්ෂා නොකළත් ඔවුන් පිළිබඳ විස්තර ඇතුලත් කළ යුතුවේ. දැනටමත් එක්සත් ජනපදයේ පුරවැසියකු වන හෝ නීත්‍යානුකූල ස්ථිර පදිංචිය ඇති කලත්‍රයා හෝ දරුවකුගේ ඡායාරූප ඇතුළත් කළ යුතු නැත.

ඔබේ කලත්‍රයා හා ලැයිස්තු ගතකොට ඇති එක් එක් දරුවා සඳහා අවශ්‍ය වන ඡායාරූප E-DV පද්ධතියට ඉදිරිපත් නොකිරීම එය අසම්පූර්ණ අයදුම්පතක් ලෙස සලකනු ලැබීමට හේතුවේ. එවැනි අයදුම්පතක් නොපිලිගන්නා අතර, ඒවා නැවත ඉදිරිපත් කළ යුතුය. සමූහ හෝ පවුල් ඡායාරූප පිලිනොගන්නා අතර පවුලේ සෑම සාමාජිකයෙකුට වෙන වෙනම ඡායාරූප තිබිය යුතුය

- E-DV පද්ධතියට සෑම පුද්ගලයෙකුගේම නිවැරදි ඡායාරූපය ඇතුළත් නොකිරීම ප්‍රධාන අයදුම්කරු නුසුදුසු වීමට හේතුවන අතර වීසා සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී සියලු වීසා ප්‍රතික්ෂේප වීමටද හේතු වේ.ඡායාරූප මෑතකදී ගත් ඒවා නොවීම හෝ සංස්කරණය කළ ඒවා වීම හෝ පහත විස්තර කර ඇති පිරිවිතර සපුරා නොතිබීම හෝ අයදුම්පත් නුසුදුසුවීමට හා වීසා ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.

ඩිජිටල් ඡායාරූපයක් (ප්‍රතිබිම්බයක්) ඉදිරිපත් කිරීම සඳහා උපදෙස් :

ඔබගේ, ඔබගේ කාලත්‍රයාගේ හා එක් එක් දරුවාගේ ඩිජිටල් ඡායාරූපයක් (ප්‍රතිබිම්බයක්) E-DV අයදුම්පත් ආකෘතිය සමග සබැඳි කොට ඉදිරිපත් කළ යුතුය. අලුතින් ඩිජිටල් ඡායාරූපයක් ගැනීමෙන් හෝ මුද්‍රිත ඡායාරූපයක් ස්කෑන් කිරීමෙන් ප්‍රතිබිම්බ ගොනුව සකසා ගත හැකිය. ප්‍රතිබිම්බ ගොනුව පහත සඳහන් සංයෝජන හා තාක්ෂණික පිරිවිතරට අනුකූල විය යුතුය. අයදුම්පත ඉදිරිපත් කිරීමට පෙර E-DV වෙබ් අඩවියේ ඇති ඡායාරූප සප්‍රමාණතා සන්ධානය තුළින් තමන්ගේ ඡායාරූප වල යෝග්‍යතාවය පරීක්ෂාකල හැකිය. ඡායාරූප සප්‍රමාණතා සන්ධානය පිළිගත හැකි හා පිළිගත නොහැකි ඡායාරූපවල නිදර්ශන සහිතව ඡායාරූප සංයෝජනය පිළිබඳ අතිරේක තාක්ෂණික උපදෙස්ද සපයයි.

සංයෝජන පිරිවිතර : ඉදිරිපත් කරන ලද ඩිජිටල් ප්‍රතිබිම්බය පහත සඳහන් සංයෝජන පිරිවිතරයන්ට අනුකූල විය යුතුය. එසේ නැතහොත් අයදුම්පත නුසුදුසු එකක් ලෙස සැලකෙනු ඇත

- **හිස තිබිය යුතු ආකාරය**
  - ඡායාරූප ගත කරනු ලබන පුද්ගලයා කැමරාවට සෘජුව මුහුණ දිය යුතුය.
  - පුද්ගලයාගේ හිස ඉහලට, පහළට හෝ පැත්තකට හැරී නොතිබිය යුතුය.
  - හිසේ උස හෝ මුහුණු ප්‍රදේශයේ ප්‍රමාණය (හිසකෙස්ද ඇතුලුව හිස මුදුනේ සිට නිකටේ පහල කෙළවර දක්වා මැනගත්) සම්පූර්ණ ප්‍රතිබිම්බ උසින් සියයට 50ත් සියයට 69 අතර විය යුතුය. ඇසේ උස (ප්‍රතිබිම්බයේ පතුලේ සිට ඇස්වල මට්ටම දක්වා මැනගත්) ප්‍රතිබිම්බ උසෙන් සියයට 56ත් සියයට 69ත් අතර විය යුතුය.

- **ඩිජිටල් අනුරූ හිසේ ප්‍රමාණ අඩිවුව**



Photo Requirement වෙබ් පිටුවේ ඇති නිදර්ශන පරීක්ෂා කරන්න.

- **පසුබිම**
  - ඡායාරූප ගතකරනු ලබන පුද්ගලයා මධ්‍යස්ථ ලා පැහැති පසුබිමක් ඉදිරියේ සිට ඡායරූපය ගත යුතුය.
  - අඳුරු හෝ රටා සහිත පසුබිම් පිළිගනු නොලැබේ.

- **නාභිගත කිරීම**
  - ඡායාරූපය හොඳින් නාභිගත වී තිබිය යුතුය

- **අලංකාර කරන අයිතම**
  - ඡායාරූප ගත කරනු ලබන පුද්ගලයාගේ මුහුණේ පෙනුම හීන කරන, අව් කන්නාඩි හෝ වෙනත් අයිතම පැළඳ තිබේ නම් ඒවා පිළිගනු නොලැබේ.

- **හිස්වැසුම් හා තොප්පි**
  - හිස්වැසුම් හෝ තොප්පි පැළඳ සිටින පුද්ගලයන්ගේ ඡායාරූප ඔහුගේ/ඇයගේ ආගමික විශ්වාසයන්ට අදාළ වේ නම් පමණක් පිළිගනු ලැබේ. එවැනි අවස්ථාවන්හිදී වුවද හිස්වැස්මෙන් අයදුම්කරුගේ මුහුණේ කොටසක් වැසී නොතිබිය යුතුය. ගෝත්‍රික හෝ විශේෂිත වශයෙන් ආගමික ස්වභාවයේ නොවන ශීර්ෂාවරණ සහිත අයදුම්කරුවන්ගේ ඡායාරූප පිළිගනු නොලැබේ. තොප්පි පැළඳසිටින යුදහමුදා, ගුවන්සේවා සාමාජිකයන්ගේ හෝ එවැනි අනිකුත් පුද්ගලයන්ගේ ඡායාරූපද පිළිගනු නොලැබේ.

බිටු-24 වර්ණ ගැඹුරක් සහිත වර්ණ ඡායාරූප අවශ්‍ය වේ. වර්ණ ඡායාරූප කැමරාවකින් පරිගණකයෙහි ගොනුවකට බාගත කිරීමට හෝ ඒවා පරිගණකයකට ස්කෑන් කිරීමෙන්ද මෙය කළ හැකිවේ. ඔබ ස්කෑනරයක් භාවිතා කරන්නේ නම්, සිටුවම සත්‍ය වර්ණ හෝ බිටු-24 වර්ණ ප්‍රකාරයට විය යුතුය. ස්කෑන් කිරීමේ අමතර අවශ්‍යතා සඳහා පහත කොටස බලන්න.

තාක්ෂණික පිරිවිතර

ඉදිරිපත් කරන ඩිජිටල් ඡායාරූපය පහත සඳහන් පිරිවිතරට අනුකූල විය යුතුය. එසේ නොවුවහොත් පද්ධතිය ස්වයංක්‍රීයව E-DV අයදුම්පත් පෝරමය ප්‍රතික්ෂේප කර, ඒබව එවූ තැනැත්තාට දැනුම් දෙයි.

- **අලුත් ඩිජිටල් ප්‍රතිබිම්බයක් ලබා ගැනීම:** අලුත් ඩිජිටල් ප්‍රතිබිම්බයක් ගන්නේ නම් එය පහත සඳහන් පිරිවිතරට අනුව විය යුතුය.

  - ප්‍රතිබිම්බ ගොනුවෙහි හැඩතලය : ප්‍රතිබිම්බය ඒකාබද්ධ ඡායාරූපීය විශේෂඥ කණ්ඩායමේ (JPEG) හැඩතලය අනුව විය යුතුය.

  - ප්‍රතිබිම්බ ගොනුවෙහි ප්‍රමාණය : ප්‍රතිබිම්බ ගොනුවෙහි උපරිම ප්‍රමාණය කිලෝ බයිට් 240 විය යුතුය (240 KB)

  - ප්‍රතිබිම්බ විභේදනය සහ මාන : පිලිගතහැකි අවම මාන වන්නේ පික්සල 600 (පළල) X පික්සල් 600 (උස) වේ. ප්‍රතිබිම්බ පික්සල මාන හතරැස් දර්ශානුපාතයක් විය යුතුය (උස පළලට සමාන විය යුතුය)

  - ප්‍රතිබිම්බ වර්ණ ගැඹුර : ාතිබිම්බය වර්ණයෙන් විය යුතුය (පික්සලයට බිටු -24) බිටු - 24 කළු සුදු, හෝ බිටු-8 ප්‍රතිබිම්බ පිලි නොගැනේ.

- **ඉදිරිපත් කළ ඡායාරූපයක් ස්කෑන් කිරීම :** මුද්‍රිත ඡායාරූපයක් ස්කෑන් කිරීමට පෙර, එය ඉහත දැක්වූ සංයෝජන පිරිවිතරට අනුකූල විය යුතුය. මුද්‍රිත ඡායාරූපය මුද්‍රණ වර්ණ හා සංයෝජන පිරිවිතර සපුරාලන්නේ නම් පහත පිරිවිතරට අනුව එය ස්කෑන් කරන්න.

- ස්කෑනර් විභේදනය : අඩුම වශයෙන් අභලකට තිත් (dpi) 300 විභේදනයට ස්කෑන් කළයුතුය.
- ප්‍රතිබිම්බ ගොනු හැඩතලය : ප්‍රතිබිම්බ, ඒකාබද්ධ ඡායාරූපීය විශේෂඥ කණ්ඩායමේ (JPEG) හැඩතලය අනුව විය යුතුය.
- ප්‍රතිබිම්බ ගොනුවේ ප්‍රමාණය : ප්‍රතිබිම්බ ගොනුවේ ප්‍රමාණය උපරිම වශයෙන් කිලෝ බයිට් 240 (240 KB) විය යුතුය.
- ප්‍රතිබිම්බ විභේදනය : පික්සල් 600x600
- ප්‍රතිබිම්බ වර්ණ ගැඹුර : බිටු 24 වර්ණ. (කළුසුදු, ඒක වර්ණ හෝ අළුවන් ප්‍රතිබිම්බ භාර නොගන්නා බව සලකන්න)

ඉලෙක්ට්‍රොනික ලොතරැයියට ඇතුළත්වීම සඳහා අවශ්‍ය තොරතුරු

DV 2014 ලොතරැයියට ඇතුල්වීමට ඇත්තේ එකම මාර්ගයක් පමණි. ඔබ කළ යුත්තේ www.dvlottery.state.gov වෙබ් අඩවියෙන් පමණක් ලබාගත හැකි DS 5501ඉලෙක්ට්‍රොනික විවිධත්ව වීසා අයදුම්පත (E-DV අයදුම්පත) ඉදිරිපත් කිරීමයි. **එය මුලුමනින්ම සම්පූර්ණ කිරීමට අසමත් වීම වැඩසටහනට ඇතුල්වීමට නුසුදුස්සෙක් වීමට හේතු වේ. ඉලෙක්ට්‍රොනික අයදුම්පත් ඉදිරිපත් කරන්නන්ගෙන් E-DV පෝරමයේ පහත සඳහන් තොරතුරු ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටිනු ඇත.**

දැන්වීම: අයදුම්කරුවන් වෙනුවෙන් අයදුම්පත් ඉදිරිපත් කිරීමට සේවා සපයන 'වීසා උපදේශකයන්', වීසා ඒජන්තවරුන් හෝ අනිකුත් පුද්ගලයන්ගේ සහාය නොමැතිව අයදුම්පත් සම්පූර්ණ කරන ලෙස රාජ්‍ය දෙපාර්තමේන්තුව අයදුම්කරුවන් තදින්ම දිරි ගන්වනු ලැබේ. ඔබේ අයදුම්පත සම්පූර්ණ කිරීමට වෙනත් කෙනෙකුගේ සේවය ලබාගන්නේ නම්, එය පිළියෙල කරන අවස්ථාවේ ඔබ සිටිය යුතු අතර, තහවුරු කිරීමේ පිටුව හා ඔබේ අනුපම තහවුරු අංකය ඔබ ලඟ තබා ගත යුතුය. තහවුරු කිරීමේ තොරතුරු ඔවුන් ලඟ තබා ගනිමින් තෝරා ගනු ලැබූ අයදුම්කරුවන්ට කෙළින්ම යා යුතුව තිබූ දැනුම් දීමේ තොරතුරු ඔවුන්ට ලබා දීමට මෙම වීසා පහසුකම් සපයන්නන්, තෝරා ගනු ලැබූ අයදුම්කරුවන්ගෙන් නීත්‍යානුකූල නොවන ආකාරයට මුදල් ලබා ගනී.

සිහිකැඳවීම: පසුව E-DV වෙබ් අඩවියට ප්‍රවේශ වීමට, ඔබේ DV-2014 සබැඳි ලියාපදිංචි වීමේදී ලැබුණු අනුපම තහවුරු කිරීමේ අංකය අවශ්‍ය වේ. ප්‍රවේශ තත්ව පරීක්ෂා තුලින් ඔබේ අයදුම්පත තේරී ඇත්ද යන්න ගැන තොරතුරු ලබාගැනීම සඳහා.2013මැයි 01 වැනිදායින් පසුව www.dvlottery.state.gov වෙබ් අඩවියට ප්‍රවේශවීම අවශ්‍ය වේ. ඔබ DV-2014 සඳහා තේරී ඇත්ද යන්න දැනුම් දීමේ එකම ක්‍රමය ප්‍රවේශ තත්ව පරීක්ෂාව වේ. ඔබේ අයදුම්පත පිළිබඳව වැඩිදුර කටයුතු කරන ආකාරය, ඔබේ සංක්‍රමණික වීසා සම්මුඛ සාකච්ඡා දිනය හා වේලාව දැන්වීම ආදි උපදෙස් එයින් ලබා දෙනු ඇත. ඔබේ තහවුරු තොරතුරු නැතිවුවහොත්, ඔබට DV අයදුම්පත්‍රයේ තත්වය පරීක්ෂා කළ නොහැකි වනු ඇත.

1. **සම්පූර්ණ නම :** අවසන්/පවුලේ නම, පළමු නම, මැද නම (ඔබේ ගමන් බලපත්‍රයේ සඳහන් ආකාරයටම ඔබේ නම ඇතුල් කරන්න.
2. **උපන් දිනය**: දිනය, මාසය, වර්ෂය
3. **ස්ත්‍රී පුරුෂ භාවය :** පුරුෂ හෝ ස්ත්‍රී
4. **ඔබ උපන් නගරය:**

5. **ඔබ උපන් රට :** රටේ නම විය යුත්තේ ඔබ උපන් ප්‍රදේශයට දැනට භාවිත කරනු ලබන නමයි.

6. **DV වැඩසටහනට සුදුසුකම් ලබන රට හෝ අදාල රට :** සාමාන්‍යයෙන් සුදුසුකම් ලබන රට ඔබ උපන් රටයි. ඔබ සුදුසුකම් ලබන රට, ඔබ ජීවත් වන රටට සම්බන්ධයක් නැත. DV වැඩසටහනට සුදුසුකම් නොලබන රටක ඔබ ඉපදී ඇත්නම් ඔබට ඉල්ලා සිටිය හැකි අදාළ රටක් සඳහා වෙනත් විකල්පයක් ඇත්දැයි දැන ගැනීමට උපදෙස් සමාලෝචනය කරන්න. ඉල්ලා සිටිය හැකි රට පිළිබඳ ව අතිරේක තොරතුරු සඳහා කරුණාකර මෙම උපදෙස් වල නිති අසන පැන #01 බලන්න.

7. **අයදුම්පතේ ඡායාරූප**: ඡායාරූප පිරිවිතර පිළිබඳ තාක්ෂණික තොරතුරු බලන්න. අදාළ වන්නේ නම් ඔබගේ කලත්‍රයාගේ හා සියලු දරුවන්ගේ, ඡායාරූප ඇතුළත් කිරීමට සහතික වන්න. නිති අසන පැන # 03 බලන්න.

8. **තැපැල් ලිපිනය :** බාරේ, ලිපිනය පේළිය 1, ලිපිනය පේළිය 2, මහනගරය/ නගරය, දිස්ත්‍රික්කය/ පළාත/ ජනපදය/ රට, තැපැල් කේතය/ සිප් කේතය සහ රට.

9. **ඔබ අද ජීවත්වන රට**

10. **දුරකථන අංකය (කැමතිනම්)**

11. **ඉ-තැපැල් ලිපිනය : ඔබට කෙලින්ම ප්‍රවේශවිය හැකි ඉ-තැපැල් ලිපිනයක් ලබාදෙන්න. තෝරාගත් බව දන්වන නිල දැනුම්දීම මෙම ලිපිනයට නොලැබෙනු ඇත. කෙසේ වෙතත් ඔබේ අයදුම්පත තේරුණහොත් හා ප්‍රවේශ තත්ව පරීක්ෂාව තුලින් ඔබේ තේරීම ගැන ප්‍රතිචාර දැක්වුවහොත් ඔබේ සංක්‍රමණික වීසා සම්මුඛ පරීක්ෂණය පිළිබඳ තොරතුරු ප්‍රවේශ තත්ව පරීක්ෂාවේ ඇති බව දන්වන ඉ-තැපැල් පණිවුඩයක් රාජ්‍ය දෙපාර්තමේන්තුවෙන් ඔබට ලැබෙනු ඇත. රාජ්‍ය දෙපාර්තමේන්තුව මෙම ඉ-තැපැල් ලිපිනයෙන් ඔබව ඇමතීමට ඉඩ ඇතත් ඔබ DV වැඩසටහනට තෝරාගත් බව දන්වන ඉ-තැපල් පණිවුඩයක් කිසිදා එවනු නොලැබේ.**

12. **අද වන විට ඔබ ලබා ඇති ඉහළම අධ්‍යාපන මට්ටම කුමක්ද?** ඔබ ලබා ඇති ඉහළම මට්ටම පහත සඳහන් කුමකින් නියෝජනය වේ දැයි සඳහන් කරන්න. (1). ප්‍රාථමික පාසල පමණයි (2). උසස් පාසල. උපාධියක් නැත. (3). උසස් පාඨශාලා උපාධිය. (4). වෘත්තීය පාසල. (5). ඇතැම් විශ්ව විද්‍යාල පාඨමාලා. (6). විශ්ව විද්‍යාල උපාධිය. (7). පශ්චාත් උපාධි මට්ටමේ පාඨමාලා (8). ශාස්ත්‍රපති උපාධිය. (9). ආචාර්ය උපාධි මට්ටමේ සමහර පාඨමාලා සහ (10) ආචාර්ය උපාධිය

13. **විවාහක අවිවාහක තත්වය :** අවිවාහක, විවාහක, දික්කසාද, වැන්දඹු, නීතියෙන් වෙන් වූ

14. **දරුවන් ගණන** : ඔබේ අයදුම්පතට ඔබේ කලත්‍රයා සහ සියලු ම ස්වාභාවික දරුවන්ගේ නම්, උපන් දිනය හා උපන් ස්ථානය ඇතුළත් විය යුතුය. ඔබ අයදුම්පත ඉදිරිපත් කරන දිනයට වයස අවුරුදු 21 ට අඩු සියලු ම විවාහ වී නැති, නීත්‍යානුකූලව හදා වඩා ගත් දරුවන් හා සුළු දරුවන් ද ඇතුළත් විය යුතුය. දරුවාගේ දෙමව්පියන් සමග ඔබ නීත්‍යානුකූලව නීතියෙන් විවාහක නොවුවත්, ඔබේ කලත්‍රයා හෝ ඔබේ දරුවන් දැනට ඔබ සමග ජීවත්ව නොසිටියත්, ඔවුන් ඔබ සමග සංක්‍රමණය වීමට බලාපොරොත්තු නොවුවත් ඔවුන් පිළිබඳව තොරතුරු ඇතුළත් කළ යුතුය. විවාහක දරුවන් හා වයස අවුරුදු 21 හෝ ඊට වැඩි දරුවන් විවිධත්ව වීසා සඳහා සුදුසුකම් නොලබන බව සලකන්න. කෙසේ වෙතත් සමහර අවස්ථාවන්හිදී වයස් සීමාව ආසන්නයේ සිටින දරුවන්ට එක්සත් ජනපද නීතියේ රැකවරණය ලැබේ. ඔබේ අවිවාහක දරුවෙක් වයස 21 වීමට පෙර ඔබ ඉලෙක්ට්‍රොනික අයදුම්පත ඉදිරිපත් කර, වීසා නිකුත් කරන අවස්ථාවේදී දරුවා වයස 21 ඉක්මවා සිටියහොත් ළමා තත්ව ආරක්ෂණ පනත යටතේ වීසා කටයුතු සඳහා ඔහු/ ඇය වයස 21 කට අඩු ලෙස සලකනු ඇත. දැනටමත් එක්සත් ජනපද පුරවැසියෙක් හෝ නීත්‍යානුකූල ස්ථීර නේවාසිකයන් වන ඔබේ කලත්‍රයා හෝ දරුවන් ලැයිස්තු ගත නොකල යුතු

වන්නේ ඔවුන් විවිධත්ව වීසා (DV) සඳහා සුදුසුකම් නොලබන බැවිනි. **සුදුසුකම් ඇති සියලු දරුවන් ලැයිස්තුවට ඇතුළත් කිරීමට අසමත් වීම, ප්‍රධාන අයදුම්කරු නුසුදුසුවීමට හේතුවන අතරම, වීසා සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී සියලු වීසා ප්‍රතික්ෂේප වීමට ද හේතු වේ.** <u>නිති අසන පැන # 11 බලන්න.</u>

15. **කලත්‍රයාගේ තොරතුරු :** නම, උපන් දිනය, ස්ත්‍රී පුරුෂ භාවය, උපන් මහ නගරය/නගරය, උපන් රට හා ඡායාරූපය ඇතුලත් විය යුතුය. **ඔබගේ කලත්‍රයා පිළිබඳ විස්තර ඇතුලත් නොකිරීම ප්‍රධාන අයදුම්කරු නුසුදුස්සකු වීමට හේතු වනු පමණක් නොව වීසා සම්මුඛ පරීක්ෂණයේදී සියලුම වීසා ප්‍රතික්ෂේප වීමට ද හේතු වේ.** ඔබ වීසා අයදුම්කිරීමට පෙර දික්කසාද වීමට සැලසුම් කලත්, ඔබේ කලත්‍රයා මෙහි ලැයිස්තුගත කළ යුතුය.

16. **දරුවන්ගේ තොරතුරු :** නම, උපන් දිනය, ස්ත්‍රී පුරුෂ භාවය, උපන් මහ නගරය/ නගරය, උපන් රට, ඡායාරූපය. ඉහත 14 විස්තර කර ඇති සියලු දරුවන් පිළිබඳ තොරතුරු ඇතුළත් කරන්න.

අයදුම්කරුවන් තෝරා ගැනීම

ඒ ඒ කලාප හා රටවලට ලබාදියහැකි වීසා ප්‍රමාණය මත පදනම්ව සියලුම සුදුසුකම් ලැබූ අයදුම්පත් අතුරින් පරිගණකය අහඹු ලෙස පුද්ගලයන් තෝරා ගනු ඇත. DV වැඩසටහන යටතේ තමන් තේරී ඇත්ද, නැත්ද යන්න ගැන දැනගැනීමට සියලුම විවිධත්ව වීසා (DV-2014) අයදුම්කරුවන් DV-2014 සඳහදි ලියාපදිංචියේදී ලැබුණු අනුපම තහවුරු අංකය යොදා ගනිමින් E-DV වෙබ් අඩවියේ ප්‍රවේශ තත්ව පරීක්ෂාවට යා යුතුය. 2013 මැයි 01 වැනිදා සිට 2014 ජුනි 30 දක්වා E-DV වෙබ් අඩවියේ (www.dvlottery.state.gov) ප්‍රවේශ තත්ව පරීක්ෂාව ක්‍රියාත්මක වේ. **තේරුණු අය එක්සත් ජනපදයට සංක්‍රමණය වීම හා සම්බන්ධ ගාස්තු ඇතුළු වැඩිදුර උපදෙස් ලබාදෙන තහවුරු පිටුවකට යොමු කෙරෙනු ඇත.** DV-2014 සඳහා තේරුණු අයට ඒ බව දැනුම්දෙන එකම ක්‍රමය ප්‍රවේශ තත්ව පරීක්ෂාව වේ. **රාජ්‍ය දෙපාර්තමේන්තුව ඒ බව දැනුම්දෙන ලිපි තැපෑලෙන් එන්නේ නැත. අහඹු ලෙස තෝරාගත් අයට, එම තෝරාගැනීම ගැන ඉ-තැපෑලෙන්ද දැනුම් දෙනු නොලැබේ. තෝරා නොගත් අයටද ඔවුන්ගේ තෝරා නොගැනීම ගැන වෙබ් පදනම් වූ ප්‍රවේශ තත්ව පරීක්ෂාවෙන් දැනගත හැකිවේ. එක්සත් ජනපද තානාපති කාර්යාල හෝ කොන්සියුලර් කාර්යාලවලින් තෝරාගත් අයගේ ලැයිස්තුවක් ලබා නොදේ.** තෝරා ගනු ලැබූ අයදුම්කරුවන්ගේ කලත්‍රයන් සහ වයස අවුරුදු 21ට අඩු අවිවාහක දරුවන්ටද, ප්‍රධාන අයදුම්කරු සමග යාමට හෝ පසුව ඔහුට සම්බන්ධ වීමට වීසා සඳහා අයදුම් කළ හැකිය. DV-2014 වීසා, 2013 ඔක්තෝබර් 1 වැනි දින හා 2014 සැප්තැම්බර් 30 දින අතර කාලයේදී නිකුත් කරනු ලැබේ.

අයදුම්පත් සැකසීමේ කටයුතු සහ සාර්ථක අයදුම්කරුවන් හා ඔවුන්ගේ සුදුසුකම් ලත් පවුල් සාමාජිකයන්ට විවිධත්ව වීසා නිකුත් කිරීම 2014 සැප්තැම්බර් 30 වන දින මධ්‍යම රාත්‍රියට පෙර අවසන් විය යුතුය. කිසිම හේතුවක් නිසාවත් මෙම දිනයට පසුව විවිධත්ව වීසා නිකුත් කිරීමක් හෝ වෙනස් කිරීමක් අනුමත නොකරනු ඇත. ප්‍රධාන අයදුම්කරු හා එක්වීමට පවුලේ සාමාජිකයන්ට විවිධත්ව වීසා ලබාගැනීමටද මෙම දිනයට පසු හැකි නොවේ.

එක්සත් ජනපදයට සංක්‍රමණය වීම සඳහා විවිධත්ව වීසා ලැබීමට, අහඹු ලොතරැයියෙන් තෝරාගනු ලැබූ අය එක්සත් ජනපද නීතිය යටතේ සියලු සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවන් සියල්ල සපුරා ලිය යුතුය. ත්‍රස්තවාදයට අනුග්‍රහ දක්වන රාජ්‍යයන් ලෙස හඳුනාගෙන ඇති රටවල් ඇතුලු සමහර රටවල වැසියන් සම්බන්ධයෙන් මෙම අවශ්‍යතාවයන් සපුරාලීමට පැවැත්විය යුතු පරීක්ෂා මට්ටම මෙන්ම වීසා සකස් කිරීමට ගතවන කාලයද සැලකිය යුතු අන්දමින් වැඩිවිය හැක.

වැදගත් නිවේදනයයි

වාර්ෂික DV වැඩසටහනෙහි දී ඉලෙක්ට්‍රොනික ලොතරැයියට ඇතුළත් වීම නොමිලේයි. **රාජ්‍ය දෙපාර්තමේන්තුව මේ සඳහා කිසිදු ගාස්තුවක් අය නොකරයි.** එක්සත් ජනපද රජය DV වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිණිස බාහිර උපදේශකවරුන් හෝ පෞද්ගලික සේවා හෝ ලබා නොගනී. අයදුම්පත් පිළියෙල කිරීමට සහාය සපයන අතරමැදියන් හෝ වෙනත් අය කටයුතු කරන්නේ එක්සත් ජනපද රජයේ කැමැත්ත හෝ අධිකාරිය ඇතිව නොවේ. DV අයදුම්පත් පිළියෙල කිරීමට බාහිර අතරමැදියකුගේ සහාය ලබාගැනීම සම්පූර්ණයෙන්ම අයදුම්කරුගේ අභිමතය පරිදි වේ. මහජනතාවට නීත්‍යානුකූලව විවිධත්ව වීසා (DV) වැඩසටහනට ලියාපදිංචි විය හැකි එකම වෙබ් අඩවිය www.dvlottery.state.gov පමණි.

අයදුම්කරුවන් විසින් කෙළින්ම ඉදිරිපත් කරන සුදුසුකම් ලැබූ ඉලෙක්ට්‍රොනික අයදුම්පතකට තේරීමට ඇති ඉඩ ප්‍රස්තාව අයදුම්කරුවන් වෙනුවෙන් බාහිර මැදිහත් කරුවන් ඉදිරිපත් කරන සුදුසුකම් ලත් අයදුම්පතකට ඇති ඉඩ ප්‍රස්තාවට සමාන වේ. **කෙසේ වෙතත් කුමන ප්‍රභවයකින් ලැබුනත් යම් පුද්ගලයෙක් වෙනුවෙන් එකකට වැඩි ප්‍රමාණයක් අයදුම්පත් ලැබීම එම පුද්ගලයා ලියාපදිංචිය සඳහා නුසුදුස්සෙක් කිරීමට හේතුවේ.**

නිති අසන පැන

1. ''සුදුසුකම'', ''ස්වදේශිකයා''සහ ''අදාළත්වය'' යන පදවල තේරුම කුමක්ද ? සුදුසුකම් නොලබන රටක පුද්ගලයන්ට අයැදුම් කළ හැකි අවස්ථා තිබේද?

සාමාන්‍යයෙන් සුදුසුකම් ලබන රට යනු ඔබ උපන් රටයි. සුදුසුකම් ලබන ඔබගේ රට ඔබ දැනට ජීවත්වන රටට සම්බන්ධයක් නැත. "ස්වදේශිකයා" යනුවෙන් සාමාන්‍යයෙන් අදහස් කෙරෙන්නේ පුද්ගලයා දැනට පදිංචි වී සිටින හෝ ජාතිකත්වය ලබා සිටින රට ගැන නොසලකා, ඔහු උපන් රටයි. සංක්‍රමණික කටයුතු සඳහා ස්වදේශිකයා යන්නෙන්, සංක්‍රමණ හා ජාතිකත්ව පනතේ 202 (ආ) වගන්තියෙහි විධිවිධාන යටතේ ඔහු/ඇය උපන් රට හැර, වෙනත් රටක්, අදාළ රට ලෙස සැලකිය හැකිය.

උදාහරණයක් වශයෙන්, මේ වර්ෂයේ DV වැඩසටහන සඳහා සුදුසුකම් නොලබන රටක ඔබ උපන්නේ නම්, ඔබේ කලත්‍රයා උපන් රටට ඔබේ අදාළත්වය ඉල්ලා සිටීමට පුළුවන. නමුත් ඔබට DV-1 වීසාවක් නිකුත් කරනු ඇත්තේ ඔබේ කලත්‍රයාට DV-2 වීසාවක් සඳහා සුදුසුකම් ඇත්නම් හා ඔබ දෙදෙනාම එකවිට එක්සත් ජනපදයට ඇතුල්වන්නේ නම් පමණි. මේ ආකාරයටම බාල වයස්කරුවන්ටද තම දෙමව්පියන් උපන් රට, තමාට අදාළ රට ලෙස ගත හැකිය.

අවසාන වශයෙන් ඔබ මේ වර්ෂයේ DV වැඩසටහන සඳහා සුදුසුකම් නොලබන රටක ඉපදී ඇත්නම් ඔබේ දෙමව්පියන්ගෙන් එක් අයෙක් උපන් රට ඔබට අදාළ රට ලෙස සැලකිය හැකි වේ. මෙසේ කළ හැක්කේ ඔබේ දෙමව්පියන්ගෙන් එක් අයෙකුවත් ඔබ උපදින අවස්ථාවේ එම රටේ වාසය නොකලේනම් පමණකි. සාමාන්‍යයෙන් යමෙක් කිසියම් රටක ඉපදී හෝ නීත්‍යානුකූල රටවැසි භාවය ලබා නොගෙන තාවකාලිකව එම රටට පැමිණ සංචාරය කිරීම, අධ්‍යාපන කටයුතු, ආදියේ නිරතවන්නේ නම් හෝ රජයේ හෝ සමාගමක කටයුතු සඳහා එහි නතර වී සිටින්නේ නම් ඔවුන් එම රටේ පදිංචිකරුවන් ලෙස නොසැලකේ. ඔබ විකල්ප වශයෙන් අදාල රටක් ඉල්ලා සිටින්නේ නම් එම තොරතුරු ඉලෙක්ට්‍රොනික සබැඳි අයදුම්පතේ 6 වැනි ප්‍රශ්නය යටතේ ඉදිරිපත් කල යුතුය. සුදුසුකම් ලබන රට හෝ අදාළ රට ලෙස වැරදි රටක් නම් කිරීම (ඔබට තහවුරු කළ නොහැකි) ඔබේ අයදුම්පත නුසුදුසු වීමට හේතු විය හැකි බව සලකන්න.

2. **මට ලැබුණු තෝරා ගැනීම පිළිබඳ දැන්වීම් අව්‍යාජ යයි මා දැනගන්නේ කෙසේද? අහඹු DV ලොතරැයියෙන් සත්‍ය වශයෙන් මා තෝරාගනු ලැබුවේදැයි මා තහවුරු කරගන්නේ කෙසේද?**

අන්තර්ජාලයේ සබැඳිව ලියාපදිංචියෙන් ලැබුණු ඔබේ තහවුරු කිරීමේ පිටුව අඩුම වශයෙන් 2014 ජුනි දක්වා ළඟ තබාගන්න. E-DV වෙබ් අඩවියේ (www.dvlottery.state.gov) ප්‍රවේශ තත්ව පරීක්ෂාව තුලින් ඔබේ අයදුම්පත පිළිබඳව තොරතුරු දැනගැනීමට ඔබේ තහවුරු කිරීමේ අංකය අවශ්‍යවනු ඇත. DV 2014 අයදුම්කරුවන්ට ඔවුන් තෝරාගැනීම, අයදුම්පත පිළිබඳව වැඩිදුර කටයුතු කිරීම, සංක්‍රමණික වීසා සම්මුඛ පරීක්ෂණයේ දිනය හා වේලාව දැනුම් දීම ආදී සියල්ල සිදුවන එකම ක්‍රමය ප්‍රවේශ තත්ව පරීක්ෂාව වෙයි. විවිධත්ව වීසා වැඩසටහනට **නිල සබැඳි අයදුම්පත් ඉදිරිපත් කළ හැකි මෙන්ම තත්ව පරීක්ෂාවට ප්‍රවේශ විය හැකි රාජ්‍ය දෙපාර්තමේන්තුවේ බලය ලත් එකම වෙබ් අඩවිය වන්නේ** www.dvlottery.state.gov **වෙබ් අඩවිය බව දැනුම් දෙනු ලැබේ.**

තත්ව තොරතුරු 2013 මැයි 01 වැනිදා සිට අඩුම වශයෙන් 2014 ජුනි 30 දක්වා ලබාගත හැකිවේ. **ඔබේ DV ප්‍රවේශ තත්වය පරීක්ෂා කිරීමට ඔබේ තහවුරු කිරීමේ තොරතුරු තිබිය යුතුය.**. DV වීසා අයදුම්පත ඉදිරිපත් කිරීම ගැන අතිරේක උපදෙස් දෙනු ලබන්නේ අහඹු ලෙස තෝරාගත් අයට පමණි. නොතේරුණු පුද්ගලයන්ටද නිල DV වෙබ් අඩවිය තුලින් ඒ පිළිබඳ තොරතුරු ලබාගත හැකි නමුත් ඔවුන්ට අතිරේක උපදෙස් නොලැබෙනු ඇත. එක්සත් ජනපද තානාපති කාර්යාල හෝ කොන්සියුලර් කාර්යාලය වලට තත්ව පරීක්ෂා පද්ධතියට ප්‍රවේශ විය නොහැකි අතර, ඔබ වෙනුවෙන් එම පද්ධතියේ විමසුම් කිරීමට හැකියාවක් නැත. රාජ්‍ය දෙපාර්තමේන්තුවට වීසා ක්‍රියාපිළිවෙල අනුගමනය කළ යුතු, තෝරාගත් අයගේ ලැයිස්තුවක් සැපයීමටද නොහැක.

E-DV වෙබ් අඩවියේ (www.dvlottery.state.gov) ප්‍රවේශ තත්ව පරීක්ෂාව තුලින් අහඹු ලෙස තෝරාගත් අයදුම්කරුවන්ට DV වීසා අයදුම් කිරීම පිළිබඳ දැනුම් දීමක් ලැබෙනු ඇත. උපදෙස් වලින් කියැවෙන්නේ, වීසා අයදුම් කරන අවස්ථාවේදී එක්සත් ජනපද තානාපති කාර්යාලයේදී හෝ දූතමණ්ඩල කාර්යාලයේදී පමණක් සියලු විවිධත්ව හා සංක්‍රමණ වීසා ගාස්තු, තෝරාගනු ලැබූ අයදුම්කරුවන් විසින් ගෙවිය යුතු බවයි. දූත මණ්ඩල අයකැමිට කරන ලද ගෙවීම් සඳහා එක්සත් ජනපද ආණ්ඩුවේ ලදුපතක් වහාම වීසා අයදුම්කරුට ලබා දෙනු ඇත. වීසා ඉල්ලුම් කරන තෝරාගත් අයදුම්කරුවන් තැපෑලෙන්, වෙස්ටර්න් යුනියන් හරහා හෝ වෙනත් බෙදාහැරීම් සේවාවක් මගින් DV ගාස්තු සඳහා වූ මුදල් කිසි විට එවිය යුතු නොවේ. තත්වය වෙනස් කිරීමට ඉල්ලා සිටින, දැනටමත් එක්සත් ජනපදයේ සිටින තෝරාගත් අයදුම්කරුවන්ට එක්සත් ජනපද බැංකුවකට DV ගාස්තු ගෙවන ආකාරය පිළිබඳව වෙනමම උපදෙස් ලැබෙනු ඇත.

අන්තර්ජාලයේ E-DV වැඩ සටහන සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ එක්සත් ජනපද රජයේ නිල E-DV වෙබ් අඩවිය (www.dvlottery.state.gov) තුලින් පමණි. තෝරාගත් අයදුම්කරුවන්ට දැනුම්දීමේ ලිපි එවනු නොලැබේ එක්සත් ජනපද රජය, තෝරාගනු ලැබූ පුද්ගලයන්ට ඒ බව දන්වා ඉ-තැපැල් පණිවුඩ කිසිදා එවා නැති අතර, DV-2014 වැඩසටහන තුළද එසේ කිරීමට සැලසුමක් නැත. තෝරාගත් අය ප්‍රවේශ තත්ව පරීක්ෂාවේ ඇති දැනුම් දීමේ උපදෙස්වලට ප්‍රතිචාර දැක්වීමෙන් පසුව වීසා සම්මුඛ පරීක්ෂණය පිළිබඳව දැනුම් දෙන ඉ-තැපැල් පණිවුඩයක් ලැබෙනු ඇත. මෙම ඉ-තැපැල් පණිවුඩයෙන් දන්වන්නේ සම්මුඛ පරීක්ෂණ විස්තර සඳහා ප්‍රවේශ තත්ව පරීක්ෂාව විමසන ලෙසයි. එම ඉ-තැපැල් පණිවුඩයේ සම්මුඛ පරීක්ෂණයේ දිනය හා වේලාව අඩංගු නොවේ.

‘’.gov” වසම ඇතුළත් අන්තර්ජාල අඩවි පමණක් රාජ්‍ය දෙපාර්තමේන්තුවේ එක්සත් ජනපද නිල රාජ්‍ය වෙබ් අඩවි බව සලකන්න. වෙනත් බොහෝ රාජ්‍ය නොවන වෙබ් අඩවි (උදා: “.com” හෝ “.org” හෝ “.net” උපසර්ග යොදා ඇති) සංක්‍රමණ හා වීසා හා සම්බන්ධ තොරතුරු හා සේවා සපයයි. රාජ්‍ය නොවන වෙබ් අඩවිවල අඩංගු දෑ කවර ආකාරයේ ඒවා වුවත් මෙම වෙනත් වෙබ් අඩවිවල දැක්වෙන කිසිදු

තොරතුරක් හෝ කරුණක්, රාජ්‍ය දෙපාර්තමේන්තුව අනුමත කරන්නේ, නිර්දේශ කරන්නේ, හෝ අනුග්‍රහ දක්වන්නේ නැත.

තමන් නිල වෙබ් අඩවි යයි ගනුදෙනු කරුවන් හා මහජනතාව නොමග යැවීමට සමහර වෙබ් අඩවි උත්සාහ කරන අතර, ඔබ පොළඹවා ගැනීමට ඉංග්‍රීසි භාෂාවෙන් ඔබ සම්බන්ධ කර ගැනීමට ද උත්සාහ කරනු ඇත. මෙම වෙබ් අඩවි, ආකෘතිපත්‍ර හා සංක්‍රමණ කාර්ය පටිපාටි ගැන තොරතුරු වැනි සේවා සඳහා මුදල් ගෙවන ලෙස ඔබට කීමට උත්සාහ කරනු ඇත. මෙම දේවල් රාජ්‍ය දෙපාර්තමේන්තු වීසා සේවා වෙබ් අඩවියෙහි හෝ පිටරටවල තානාපති කාර්යාලවල දූත මණ්ඩල අංශ වෙබ් අඩවිවලින් නොමිලේ ලබාගත හැකිය. මීට අතිරේක වශයෙන් ඔබට නොලැබෙන සේවා සඳහා (විවිධත්ව සංක්‍රමණ අයදුම්පත සහ වීසා ගාස්තු වැනි දේ) මුදල් ගෙවන ලෙස මෙම වෙනත් වෙබ් අඩවි ඔබගෙන් ඉල්ලා සිටිනු ඇත. මෙම කූටෝපක්‍රමවලට හසුවී ඔබ මුදල් යැවුවහොත් ඔබට එය කිසිදාක නොලැබීමට ඉඩ තිබේ. තවද, අනන්‍යතා වංචා/සොරකම් සඳහා යොදාගත හැකි කිසිදු පුද්ගලික තොරතුරක් මෙම වෙබ් අඩවිවලට යැවීමේදී ද ඉතා පරිස්සම් විය යුතුය.

3. විවිධත්ව වැඩසටහන සඳහා සමහර රටවල ස්වදේශිකයන් සුදුසුකම් නොලබන්නේ කුමක් නිසාද?

විවිධත්ව වීසා වැඩසටහනේ අරමුණ වන්නේ එක්සත් ජනපදයට සංක්‍රමණිකයන් විශාල සංඛ්‍යාවක් එවන රටවල් හැර වෙනත් රටවල වැසියන් සඳහා සංක්‍රමණික අවස්ථා සපයා දීමයි. ''අධි ඇතුළත් වීම්''සහිත රටවල ස්වදේශිකයන් සඳහා විවිධත්ව වීසා ලබා නොදෙන ලෙස නීතියෙන් නියම කෙරේ. නීතියෙන් මෙය අර්ථ දක්වා ඇත්තේ පසුගිය වර්ෂ පහක කාල පරිච්ඡේදය තුළදී පවුල් අනුග්‍රහ ලැබූ සහ රැකියා පදනම් වීසා වර්ග යටතේ එක්සත් ජනපදයට පුද්ගලයන් 50,000 ක් සංක්‍රමණය වූ රටවල් ලෙසය. සෑම වර්ෂයකම වාර්ෂික විවිධත්ව ලොතරැයියට සුදුසුකම් නොලබන රටවල් හඳුනාගැනීම සඳහා එක්සත් ජනපද පුරවැසි සහ සංක්‍රමණ සේවා ආයතනය (USCIS ආයතනය) පවුල් හා රැකියා සංක්‍රමණික සංඛ්‍යා පසුගිය වර්ෂ 05 සංඛ්‍යාවලට එකතු කරයි. සෑම වාර්ෂික විවිධත්ව වීසා කාලපරිච්ඡේදයකට පෙර අලුත් නිර්ණයක් කෙරෙන බැවින් සුදුසුකම් නොලබන වැසියන් සිටින රටවල ලැයිස්තුව වර්ෂයෙන් වර්ෂයට වෙනස් වීමට ඉඩ තිබේ.

4. DV-2014 සඳහා සංඛ්‍යාත්මක සීමාව කුමක්ද?

එක්සත් ජනපද විවිධත්ව සංක්‍රමණ වැඩසටහන යටතේ සුදුසුකම් ලත් පුද්ගලයන්ට උපරිම වශයෙන් එක් වර්ෂයකදී ස්ථිර පදිංචි වීසා 55,000ක් ලබාදීමට නීතියෙන් ම ඉඩ සලසා තිබේ. කෙසේ වුවත්, 1997 නොවැම්බර් මාසයේදී කොංග්‍රසය විසින් සම්මත කරන ලද නිකරගුවානු ගැලපුම් හා මධ්‍යම ඇමරිකානු සහන පනත (NACAR) යටතේ DV-1999 දී තරම් කලින් සිට අවශ්‍යවන තාක් කල් වෙන්කරන ලද විවිධත්ව වීසා 55,000 කින් 5,000 දක්වා ප්‍රමාණයක් මෙම NACAR වැඩසටහන යටතේ ප්‍රයෝජනයට ගත හැකි වේ. සත්‍ය වශයෙන්ම මෙම විවිධත්ව වීසා සීමාව 5,000කින් අඩු කිරීම DV-2000 දී ආරම්භ වූ අතර DV-2014 වැඩසටහන තුළත් එය බල පැවැත්වෙනු ඇත.

5. DV-2014 සඳහා කලාපීය විවිධත්ව වීසා (DV) සීමා මොනවාද?

සංක්‍රමණ හා ජාතිකත්ව පනතේ (INA) 203 (ඇ) වගන්තියෙහි නියම කරන ලද සූත්‍රයට අනුව එක්සත් ජනපද පුරවැසි හා සංක්‍රමණ සේවාව (USCIS) එක් එක් වර්ෂය සඳහා කලාපීය වීසා සීමා නියම කරයි. USCIS ආයතනය මෙම ගණනය කිරීම් අවසන් කළවිට කලාපීය වීසා සීමා ප්‍රකාශයට පත් කරනු ලැබේ.

6. DV-2014 වැඩසටහන සඳහා අයදුම් පත්‍ර බාරගන්නේ කවදාද?

DV-2014 අයදුම් කාල පරිච්ඡේදය 2012 ඔක්තෝබර් 02 වැනි අඟහරුවාදා නැගෙනහිර දිවාකාල මධ්‍යාහ්නයේ (EDT) (GMT -4) සිට 2012 නොවැම්බර් 03 වැනි සෙනසුරාදා නැගෙනහිර දිවාකාල වේලාවෙන් මධ්‍යාහ්නය (EDT) (GMT-4) දක්වා වේ. සෑම වර්ෂයකදීම ලියාපදිංචිකිරීම් කාල පරිච්ඡේදය තුළදී මිනිසුන් දස ලක්ෂ ගණනක් වැඩ සටහන සඳහා අයදුම් කරති. අයදුම්පත් අතිවිශාල ප්‍රමාණයක් ලැබෙන බැවින් සාර්ථක පුද්ගලයන් තෝරා ගැනීමේදී හා පිරිසැකසුම් කිරීමේදී විශාල වැඩ කොටසක් කිරීමට සිදුවේ. ඔක්තෝබර් 02 වැනිදා නැගෙනහිර දිවාකාල මධ්‍යාහ්නයේ (EDT) සිට නොවැම්බර් 03 වැනිදා නැගෙනහිර දිවාකාල මධ්‍යාහ්නය (EDT)දක්වා අයදුම් කාල පරිච්ඡේදය පවත්වා ගැනීමෙන් තෝරා ගනු ලැබුවන්ට කාලානුරූප අයුරින් දැන්වීමටත්, වීසා අයදුම්කරුවන්ට හා අපගේ තානාපති කාර්යාලවලට හා දූත මණ්ඩලවලට වීසා සූදානම් කොට සම්පූර්ණ කොට නිකුත් කිරීමට කාලය ලබා දීමත් සහතික කෙරේ. ලියාපදිංචි කිරීම් කාල පරිච්ඡේදය තුළ දී හැකිතාක් කලින් අයදුම් කිරීමට ඔබ දිරිගන්වනු ලැබේ. ලියාපදිංචි කාල පරිච්ඡේදයේ අවසාන භාගයේදී ඇතිවන අති විශාල ඉල්ලුම නිසා පද්ධතිය මන්දගාමී වනු ඇත. 2012 නොවැම්බර් 03 වැනි සෙනසුරාදා (EDT) මධ්‍යාහ්නයෙන් පසුව කිසිදු අයදුම් පත්‍රයක් බාරගනු නොලැබේ.

7. එක්සත් ජනපදයේ සිටින පුද්ගලයන්ට වැඩසටහන සඳහා අයදුම් කළ හැකිද?

ඔව්. එසේ කළ හැකිය. අයදුම්කරු එක්සත් ජනපදයේ සිටියත් වෙනත් රටක සිටියත්, අයදුම් පත්‍රය එක්සත් ජනපදයෙන් හෝ පිටරටකින් හෝ ඉදිරිපත් කළ හැකිය.

8. වාර්ෂික E-DV ලියාපදිංචි කාල පරිච්ඡේදයේ දී එක් අයදුම්කරුවෙක් එක් අයදුම් පත්‍රයකට පමණක් සීමා විය යුතුද?

ඔව්. එක් ලියාපදිංචි කිරීම් කාල පරිච්ඡේදයක් තුළ දී නීතියෙන් ඉඩදී ඇත්තේ එක් පුද්ගලයෙක් වෙනුවෙන් එක් අයදුම් පත්‍රයකට පමණි. **එකකට වැඩි අයදුම්පත් ඉදිරිපත් කරන පුද්ගලයන් නුසුදුස්සන් කරනු ලැබේ.** ලියාපදිංචි කාල පරිච්ඡේදයේ දී අයදුම් පත්‍ර කීපයක් ඉදිරිපත් කරන්නවුන් හඳුනා ගැනීම සඳහා උසස් තාක්ෂණය හා වෙනත් ක්‍රම රාජ්‍ය දෙපාර්තමේන්තුව යොදා ගනී. එකකට වැඩි අයදුම් පත්‍ර ඉදිරිපත් කරන පුද්ගලයන් නුසුදුස්සන් කරනු ලබන අතර ඒ පිළිබඳ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් ස්ථිර වශයෙන් පවත්වා ගනු ලැබේ. ඕනෑම පුද්ගලයකුට වැඩසටහන සඳහා සෑම වර්ෂයකම නියමිත ලියාපදිංචි කිරීමේ කාල පරිච්ඡේදය තුල අයැදුම් කළ හැකි වේ.

9. සැමියා සහ බිරිඳ වෙන වෙනම අයදුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතුද?

ඔව්. සැමියා සහ බිරිඳ සුදුසුකම් අවශ්‍යතා සපුරා ඇත්නම් එක් අයකු එක් අයදුම්පත්‍රයක් බැගින් ඉදිරිපත් කළ යුතුය. දෙදෙනාගෙන් එක් අයකු තෝරා ගනු ලැබුවහොත් අනික් පුද්ගලයා ව්‍යුත්පන්න යැපෙන්නෙකුගේ තත්ත්වය ලැබීමට සුදුසු වේ.

10.මගේ E-DV අයදුම් පත්‍රයෙහි ඇතුලත් කළ යුත්තේ පවුලේ කුමන සාමාජිකයින්ද?

ඔබගේ අයදුම් පත්‍රයෙහි ඔබගේ කලත්‍රයා (එනම් සැමියා හෝ බිරිඳ) හා සියළුම වයස 21ට අඩු අවිවාහක දරුවන්, අයදුම්කරු සමඟ ජීවත් වන්නේද, එක්සත් ජනපදයට සංක්‍රමණය වීමට ලැබුණහොත් ඔහු කැටුව එන්නේද, එසේ නැත්නම් පසුව එන්නේද යනාදිය ගැන නොසලකා **ලැයිස්තු ගත කළ යුතුය**. ඔබ නීතියෙන් වෙන් වී නැත්නම් (උදා: උසාවිය විසින් හෝ උසාවි නියෝගයක් මගින් පිළිගනු ලැබූ ලිඛිත ගිවිසුම ඇති) ඔහුගෙන්/ඇයගෙන් ඔබ දැනට වෙන් වී සිටියත් කලත්‍රයාගේ නම ලැයිස්තු ගත කළ යුතුය. ඔබ නීත්‍යානුකූල ව වෙන් වී හෝ දික්කසාද වී සිටී නම් ඔබගේ කලින් කලත්‍රයාගේ නම ලැයිස්තු ගත කිරීම

අවශ්‍ය නැත. **අවිවාහක හා වයස අවුරුදු** 21 ට **අඩු ඔබගේ** සියළුම දරුවන්, ඔවුන් ඔබගේ ස්වාභාවික දරුවන් හෝ වේවා, ඔබගේ කලත්‍රයාගේ දරුවන් හෝ වේවා නැතහොත් ඔබගේ රටේ නීතියට අනුව හදා වඩා ගත් දරුවන් හෝ වේවා, ඔවුන් දැනටමත් එක්සත් ජනපදයේ පුරවැසියෙක් හෝ නීත්‍යානුකූල ස්ථිර නේවාසිකයෙක් නොවේ නම් එබඳු **සියලු දරුවන්ගේ නම් ඇතුළත් කළ යුතුය. ඔබේ දරුවන් තවදුරටත් ඔබ සමඟ වාසය නොකළත් මෙම** DV **වැඩසටහන යටතේ සංක්‍රමණය වීමට ඔවුන් බලාපොරොත්තු නොවූවත්,** ඔබේ ඉලෙක්ට්‍රෝනික අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේදී වයස 21 න් පහළ සියලු දරුවන් අයදුම්පතේ ඇතුළත් කළ යුතුය. දැනටමත් එක්සත් ජනපදයේ පුරවැසියන් හෝ නීත්‍යානුකූල ස්ථිර නේවාසිකයන් වන දරුවන් ලැයිස්තු ගත කළ යුතු නොවේ.

ඔබගේ පවුල් සාමාජිකයන් ලැයිස්තු ගත කිරීම නිසා ඔවුන් ඔබ සමග යා යුතුයැයි අදහස් නොකෙරේ. ඔවුන්ට තම රටේ නැවතීමට තීරණය කළ හැක. කෙසේ වුවත් ඔබගේ වීසා අයදුම්පතෙහි ඇතුළත් කර ඇති සුදුසුකම් ඇති යැපෙන්නකු මුල් අයැදුම් පත්‍රයෙහි ඇතුළත් කර නැත්නම්, එය ඔබ නුසුදුස්සෙක් කරයි. මෙය අදාළ වන්නේ මුල් අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේ පවුල් සාමාජිකයන් වූ අයට පමණි. පසුව සම්බන්ධ කර ගත් අයට නොවේ. ඔබගේ අයැදුම් පත්‍රයෙහි ඔබගේ කලත්‍රයා ලැයිස්තු ගත කර තිබුණත්, ඔහුට/ඇයට වෙනම අයදුම් පත්‍රයක් ඉදිරිපත් කළහැකිය. අයදුම්පත් දෙකේම සියලු යැපෙන්නන්ගේ විස්තර ඇතුළත් විය යුතුය. ඉහත පැන # 9 බලන්න

11. මගේ සම-ලිංගික සහකරු DV අයදුම්පතේ ඇතුලත් කළ හැකිද?

නැත. එක්සත් ජනපදයට සංක්‍රමණය වීම සඳහා වූ සංක්‍රමණ නීතිය සම-ලිංගික විවාහ පිළි නොගනී. කෙසේ වෙතත් ඔබගේ සමලිංගික සහකරු සුදුසුකම් පිළිබඳ සියලු අවශ්‍යතා සපුරාලන්නේනම් DV වැඩසටහන යටතේ ඔහුට / ඇයට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමට පුළුවන.

12. මගේ අයදුම්පත්‍රය මා විසින්ම ඉදිරිපත් කළ යුතුද? නැතහොත් මා වෙනුවෙන් වෙන අයකුට එසේ කළ හැකිද?

ඔබට, ඔබේ අයදුම්පත පිළියෙල කර ඉදිරිපත් කිරීමට හෝ ඔබ වෙනුවෙන් වෙනත් අයෙකුටද එය ඉදිරිපත් කිරීමට හෝ පුළුවන. පුද්ගලයෙක් කෙළින්ම අයදුම්පත ඉදිරිපත් කළත්, ඒ සඳහා නීතිඥවරයකුගේ, මිතුරකුගේ හෝ ඥතියකුගේ ආධාර ලබාගත්තද එක් පුද්ගලයකුගේ නමින් ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් වන අතර, අයදුම්පතෙහි ඇති තොරතුරු සත්‍ය හා සම්පූර්ණ බව සහතික කිරීමේ වගකීම අයදුම්කරු භාර ගත යුතුය. තෝරා නොගත් අය ද ඇතුලුව සියලුම ඉල්ලුම්කරුවන්ට නිල DV වෙබ් අඩවියේ ප්‍රවේශ තත්ව පරීක්ෂාව තුළින් (www.dvlottery.state.gov) 2013 මැයි 01 වනදා සිට තම අයදුම්පතේ තත්වය පිළිබඳව පරීක්ෂා කළ හැකි වේ. තමාගේ අයදුම්පතේ තත්වය ස්වාධීනව බලාගැනීම සඳහා අයදුම්කරුවන්, තහවුරු කිරීමේ පිටුවේ තොරතුරු තමා ළඟ තබා ගත යුතුය.

13. අධ්‍යාපනය හෝ වැඩ පළපුරුද්ද පිළිබඳ අවශ්‍යතා මොනවාද?

සෑම අයදුම්කරුවෙකුටම යටත් පිරිසෙයින් උසස් පාඨශාලා අධ්‍යාපනයක් හෝ එයට සමාන අධ්‍යාපනයක් තිබිය යුතු යයිද, නැතහොත් පසුගිය වර්ෂ පහ තුළ යටත් පිරිසෙයින් වර්ෂ දෙකක පුහුණුවක් හෝ පළපුරුද්දක් අවශ්‍ය කරන වෘත්තියක වර්ෂ දෙකක වැඩ පළපුරුද්දක් තිබිය යුතු යයි ද නීතියෙන් හා රෙගුලාසිවලින් කියැවේ. ''උසස් පාඨශාලා අධ්‍යාපනය හෝ ඊට සමාන වුවක්'' යන්න අර්ථ නිරූපණය කරන්නේ එක්සත් ජනපදයේ අවුරුදු 12ක මූලික හා ද්විතියික අධ්‍යාපන පාඨමාලාවක් සම්පූර්ණ කිරීම හෝ උසස් පාඨශාලා අධ්‍යාපනයට සමාන වන මූලික හා ද්විතියික අධ්‍යාපනය පිළිබඳ විධිමත් පාඨමාලාවක් වෙනත් රටකදී සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම යනුවෙනි. මෙම අවශ්‍යතා සපුරන්නේ විධිමත් අධ්‍යයන පාඨමාලා පමණි. තැපැල් පාඨමාලා හෝ සමානතා සහතික (පොදු සමානතා ඩිප්ලෝමා, G.E.D වැනි) පිළි නොගැනේ. වීසා සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන අවස්ථාවෙහි

දූත මණ්ඩල නිළධාරියාට අධ්‍යාපනය හෝ වැඩ පළපුරුද්ද පිළිබඳව ලියකියවිලි මගින් තහවුරු කොට පෙන්විය යුතුය.

14. විවිධත්ව වීසා වැඩසටහන සඳහා සුදුසුකම් ලබන රැකියා මොනවාද?

වැඩ පළපුරුද්ද මත සුදුසු බව තීරණය කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ O*net OnLine (DOL) දත්ත සමුදාය යොදා ගනු ලැබේ. කම්කරු දෙපාර්තමේන්තුවේ O*Net Online database වැඩ පළපුරුද්ද ''රැකියා කලාප'' පහකට වර්ග කරයි. DOL වෙබ් අඩවියෙහි බොහෝ රැකියා ලැයිස්තු ගත කර ඇතත් විවිධත්ව වීසා වැඩසටහන සඳහා ඇතැම් විශේෂිත රැකියා පමණක් සුදුසුකම් ලබයි. ඔබගේ වැඩ පළපුරුද්ද පදනම මත විවිධත්ව වීසාවක් සඳහා සුදුසුකම් ලැබීමට පසුගිය අවුරුදු පහක් තුළදී **විශේෂිත වෘත්තීය සූදානම් වීම** (SVP) **පරාසයෙහි 7.0 හෝ ඊට ඉහළින් වර්ග කරන ලද රැකියා කලාප** 4 **හෝ 5 යනුවෙන් නම් කරන ලද රැකියාවක** වර්ෂ දෙකක පළපුරුද්දක් තිබිය යුතු වේ.

15. කම්කරු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි සුදුසුකම් ලබන රැකියාවක් මා සොයා ගන්නේ කෙසේද?

සුදුසුකම් ලබන DV රැකියා කම්කරු දෙපාර්තමේන්තුවේ O*net Online database හි දක්වා ඇත. ඔබගේ රැකියාව, සුදුසුකම් ලබන්නක් දැයි සොයා බැලීමට මෙම පියවර අනුගමනය කරන්න.''රැකියා සොයන්න'' (Find Occupations) තෝරා ගෙන විශේෂිත ''රැකියා පවුල''(Job Family) තෝරා ගන්න. උදාහරණ වශයෙන් ගෘහ නිර්මාණ ශිල්පය සහ ඉංජිනේරු විද්‍යාව තෝරා ගෙන ''යන්න''(GO) ඔබන්න. ඊළඟට විශේෂිත රැකියාව සඳහා සම්බන්ධය ඔබන්න. එම උදාහරණයම අනුගමනය කරමින් අභ්‍යාවකාශ ඉංජිනේරු ඔබන්න. විශේෂිත රැකියා සම්බන්ධය තෝරා ගත් පසු ''රැකියා කලාපය''(Job Zone) පටිත්ත තෝරා ගෙන රැකියා කලාප අංකය සහ විශේෂිත වෘත්තීය සූදානම (SVP) ඇගැයීම් පරාසය සොයා ගන්න. වැඩිදුර තොරතුරු සඳහා (Diversity Visa – List of Occupations) වෙබ් පිටුවට පිවිසෙන්න.

16. සාර්ථක අයදුම්කරුවන් තෝරා ගනු ලබන්නේ කෙසේද?

එක් එක් ප්‍රදේශයකින් ලැබී ඇති සියලු අයැදුම් පත් වෙන් වෙන් ව අංක කරනු ලැබේ. ලියාපදිංචි කිරීමේ කාල පරිච්ඡේදය අවසානයේදී, එක් එක් භූගෝලීය ප්‍රදේශය සඳහා ලැබී ඇති සියලුම අයැදුම් පත්වලින් පරිගණකයක් අහඹු ලෙස අයැදුම් පත් තෝරා ගනී. ප්‍රදේශය තුළ අහඹු ලෙස තෝරා ගනු ලැබූ පළමුවැනි අයදුම් පත්‍රය පළමුවැන්න ලෙසද, තෝරා ගනු ලැබූ දෙවැනි අයදුම් පත්‍රය, දෙවැන්න ලෙසද යනාදී වශයෙනි. එක් එක් ප්‍රදේශයක ලියාපදිංචි කිරීමේ කාලය තුල ලැබුණු සියලුම අයදුම්පත් වලට තෝරා ගනු ලැබීමේ සමාන අවස්ථාවක් ලැබෙනු ඇත. අයැදුම්පතක් තෝරාගත් විට, E-DV වෙබ් අඩවියේ (www.dvlottery.state.gov) ඇති ප්‍රවේශ තත්ව පරීක්ෂාව තුලින් 2013 මැයි 01 වැනිදා සිට ඒ බව අයැදුම්කරුට දැනුම් දෙනු ලැබේ. එක්සත් ජනපද කොන්සියුලර් කාර්යාලයකදී වීසා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටින ලෙස තෝරා ගනු ලැබූ අනාගත වීසා අයදුම්කරුවන්ට උපදෙස් දෙන තුරු හෝ එක්සත් ජනපදය තුළ තත්ත්වය වෙනස් කිරීමට සුදුසුකම් ලබන්නවුන් දේශීය USCIS කාර්යාලයකට අයැදුම් කරන තුරු හෝ කෙන්ටකි කොන්සියුලර් මධ්‍යස්ථානය (KCC) විසින් මෙම කටයුතු සිදු කරනු ඇත..

වැදගත් සටහන : තෝරා ගැනීම පිළිබඳ නිල දැනුම් දීම කෙරෙන්නේ 2013 මැයි 01 වැනිදා සිට අඩුම වශයෙන් 2014 ජුනි 30 දක්වා E-DV වෙබ් අඩවියෙන් (www.dvlottery.state.gov) **ලබාගත හැකි ප්‍රවේශ තත්ව පරීක්ෂාව තුලිනි. රාජ්‍ය දෙපාර්තමේන්තුව, තෝරාගැනීම පිළිබඳ නිල දැනුම්දීම් ඉ-තැපෑලෙන් හෝ සාමාන්‍ය තැපෑලෙන් යවනු නොලැබේ. ඔබගේ** E-DV **තෝරා ගනු ලැබීම ගැන**

දැන්වීමක් ඉ-තැපෑලෙන් හෝ සාමාන්‍ය තැපෑලෙන් ඔබට ලැබුණ හොත්, ඒ නීත්‍යානුකූල දැන්වීමක් නොවන බව දැන ගන්න. ඔබේ අයදුම්පත පිළිබඳ අළුත් තොරතුරු සඳහා ප්‍රවේශ තත්ව පරීක්ෂාව සමාලෝචනය කරන ලෙස ඔබට රාජ්‍ය දෙපාර්තමේන්තුවෙන් ඉ-තැපැල් පණිවුඩයක් ලැබෙනු ඇත. රාජ්‍ය දෙපාර්තමේන්තුව කිසිදාක තැපෑලෙන් හෝ වෙස්ටර්න් යුනියන් වැනි වෙනත් සේවාවක් මගින් මුදල් එවන ලෙස ඔබෙන් ඉල්ලීමක් <u>නොකරනු</u> ඇත.

17. තෝරා ගනු ලැබුවන් තමන්ගේ තත්ත්වය USCIS සමග සකස් කර ගත යුතුද?

එසේය. සංක්‍රමණ හා ජාතිකත්ව පනතේ (INA) 245 වැනි වගන්තියේ විධිවිධාන යටතේ භෞතික වශයෙන් එක්සත් ජනපදයේ සිටින තෝරාගනු ලැබූ පුද්ගලයන්ට තත්වය වෙනස් කිරීමට සුදුසුකම් ලබා ඇත්නම් ස්ථිර පදිංචි තත්වයට වෙනස් කර ගැනීමට USCIS ආයතනයට අයැදුම් කළ හැකිය. 2014 සැප්තැම්බර් 30 වන විට DV-2014 වැඩසටහනේ ලියාපදිංචි වීම අවසන් වන බැවින් එදිනට පෙර විදේශීය කලත්‍රයා හා වයස 21ට අඩු දරුවන් ඇතුලුව සියලු දෙනාගේම කටයුතු නිමා කරගත හැකි ආකාරයට ක්‍රියා කිරීමට අයදුම්කරුවන් සහතික විය යුතුය. කිසිදු හේතුවක් නිසාවත් 2014 සැප්තැම්බර් 30 මැදියම් රෑයෙන් පසුව (EDT) DV- 2014 වැඩසටහන සඳහා වීසා අංක ලබා නොදෙනු ඇත.

18. තෝරාගනු නොලැබූ අයදුම්කරුවන්ට ඒ බව දන්වනවාද?

තෝරා නොගත් අයද ඇතුළු සියලුම අයදුම්කරුවන්ට තම අයදුම්පත තේරී ඇත්ද නැත්ද යන්න E-DV වෙබ් අඩවියේ (www.dvlottery.state.gov) තත්ව පරීක්ෂාව තුලින් බලා ගත හැකි වේ. අයැදුම් පත්‍රය ඉදිරිපත් කරන අවස්ථාවේ ලැබෙන තහවුරු පිටුවේ තොරතුරු අඩුම වශයෙන් 2014 ජුනි 30 වැනිදා වන තෙක් අයදුම්කරුවන් තමන් ළඟ තබා ගත යුතුය. DV-2014 අයදුම්පත්වල තත්වය පිළිබඳ තොරතුරු අන්තර්ජාලය තුලින් 2013 මැයි 01 වැනිදා සිට 2014 ජුනි 30 දක්වා සබැඳිව ලබාගත හැකිය. (කලින් DV වැඩසටහන (DV-2012) පිළිබඳ තොරතුරු 2012 මැයි 01 වනදා සිට 2013 ජුනි 30 දක්වා ලබාගත හැකිවේ)

19. පුද්ගලයන් කී දෙනෙකු තෝරා ගනු ලබන්නේද?

DV-2014 සඳහා වීසා 50,000 ක් ලබා ගත හැකිවේ. පළමුවෙන් තෝරා ගනු ලැබූ 50,000 න් එක්තරා කොටසක් වීසා සඳහා සුදුසුකම් නොලබන අතර, තවත් කොටසක් වීසා ලබා ගැනීමට උනන්දු නොවන බැවින්, ලබා ගත හැකි DV වීසා සියල්ල නිකුත් කළ බව සහතික කරනු පිණිස අයැදුම්පත් 50,000 කට වැඩි ප්‍රමාණයක් තෝරා ගනු ඇත. කෙසේ වුවත් මෙයින් ද අදහස් කෙරෙන්නේ, මූලික වශයෙන් තෝරා ගනු ලැබූ සියලු දෙනා සඳහා ප්‍රමාණවත් වීසා ගණනක් නොතිබිය හැකි බවය. තෝරා ගනු ලැබූ අයදුම්කරුවන්ට ලැයිස්තුවේ තමන්ට ලැබුණු ස්ථානය පිළිබඳ ව E-DV වෙබ් අඩවියේ (www.dvlottery.state.gov) ප්‍රවේශ තත්ව පරීක්ෂාව තුලින් බලා ගත හැකි වේ. දැන්වීම් උපදෙස් වල ඉල්ලා ඇති පුර්ව-සම්මුඛ පරීක්ෂණ ලිය කියවිලි හා අනිකුත් තොරතුරු සැපයූ අයැදුම්කරුවන් සඳහා DV-2014 සම්මුඛ පරීක්ෂණ 2013 ඔක්තෝබර් මාසයේදී ආරම්භ වේ. තෝරාගනු ලැබූ අයදුම්කරුවන්ට, විදේශ රටවල ඇති එක්සත් ජනපද කොන්සියුලර් කාර්යාලවල නිලධාරීන් සමග උපලේඛන ගත කරන ලද සම්මුඛ පරීක්ෂණවලට සති හතරේ සිට හයක කාලයකට පෙර වෙබ් අඩවියේ ප්‍රවේශ තත්ව පරීක්ෂාව තුලින් දැනුම් දෙනු ඇත. වීසා අංක ලබාදීමේ ඉඩ අනුව සෑම මසකම එම මාසයෙහි වීසා නිකුත් කරනු ලැබීමට සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ට වීසා නිකුත් කෙරේ. DV වීසා 50,000 ම නිකුත් කර අවසන් වූ විට වසර සඳහා වූ වැඩසටහන ද අවසන් වේ. ප්‍රතිපත්තිමය වශයෙන් වීසා අංක 2014 සැප්තැම්බර් මාසයට පෙර අවසන් විය හැකිය. වීසා ලබා ගනු කැමති, තෝරා ගනු ලැබූ අයදුම්කරුවන්, තමන්ගේ කාරණය ගැන වහාම ක්‍රියාත්මක විය යුතුය. **අහඹු තෝරා ගැනීම තුලින් තෝරා ගනු ලැබුවකු වශයෙන් ඔබට ඉබේම වීසාවක් ලැබේ යයි සහතිකයක් නැත. තෝරාගැනීමෙන් අදහස් කරන්නේ ඔබට විවිධත්ව වීසාවක් අයදුම්කිරීමට සුදුසුකම් ඇති බව හා සුදුසුකම් ඇත්නම් වීසාවක් නිකුත් කරන බවයි. වීසා නිකුත් කරනු ලබන්නේ සුදුසුකම් ඇති තෝරා ගත් අයදුම්කරුවන්ගෙන් පළමු 50,000ට පමණි.**

20. E-DV වැඩසටහන සඳහා අයදුම් කිරීමට අයදුම්කරුවන් සඳහා අවම වයසක් තිබේද?

වැඩ සටහන සඳහා අයදුම්කිරීමට අවම වයසක් නැත. අයැදුම් කරන අවස්ථාවේදී ප්‍රධාන අයැදුම්කරුට උසස් පාඨශාලා අධ්‍යාපනයක් හෝ වැඩ පළපුරුද්දක් අවශ්‍යවීම නිසා, වයස අවුරුදු 18 අඩු බොහෝ පුද්ගලයන් නුසුදුසු වීමට හේතු වේ. දෙමව්පියන් හා සහෝදර සහෝදරියන් යැපෙන්නන් ලෙස DV වීසා සඳහා සුදුසුකම් නොලබන අතර, ඔවුන් ප්‍රධාන අයැදුම්කරුගේ අයැදුම්පතේ ඇතුලත් නොකළ යුතුය.

21. E-DV වැඩසටහන සඳහා ගාස්තු අයකිරීමක් සිදු වේද?

ඉලෙක්ට්‍රොනික් අයැදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම සඳහා ගාස්තුවක් අය නොකෙරේ. DV අයැදුම්කරුවන් වීසා අයැදුම් කරන අවස්ථාවේදී අවශ්‍ය සියලු වීසා ගාස්තු තානාපති කාර්යාලයේ හෝ දූත මණ්ඩල කාර්යාලයේ දූත මණ්ඩල අයකැමිට සෘජුවම ගෙවිය යුතුය. එක්සත් ජනපදයේ සිටින අතර තත්වය වෙනස් කිරීමට තෝරාගනු ලැබූ පුද්ගලයන් අවශ්‍ය ගාස්තු කෙළින්ම USCIS ආයතනයට ගෙවිය යුතුය. විවිධත්ව වීසා සහ සංක්‍රමණ වීසා අයැදුම් කිරීමේදී අවශ්‍ය කරන ගාස්තු පිළිබඳ විස්තර, තෝරා ගනු ලැබූ අයැදුම්කරුවන්ට එවනු ලබන උපදෙස්වල අඩංගු වේ.

22. විවිධත්ව වීසාවක් සඳහා අයැදුම් කිරීමට මම තෝරාගනු ලැබුවත්, වීසාවක් ලැබීමට සුදුසුකම් ලබා නැත්නම්, ගෙවන ලද වීසා ගාස්තු මට ආපසු ලබා ගත හැකිද ?

වීසා ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම උපදෙස්වල සවිස්තරාත්මකව දක්වා ඇති සියලුම සුදුසුකම් විවිධත්ව වීසා අයැදුම්කරුවන් සපුරා තිබිය යුතුය. අයැදුම්කරුවෙක් වීසා අවශ්‍යතා සපුරා නැති බවට හෝ එක්සත් ජනපද නීතිය යටතේ විවිධත්ව වීසාවක් සඳහා සුදුසුකම් ලබා නැති බවට හෝ කොන්සියුලර් නිලධාරියෙක් තීරණය කළහොත් වීසාවක් නිකුත් කළ නොහැකි අතර ගෙවූ සියලුම ගාස්තු අයැදුම්කරුට අහිමි වේ.

23. වීසා ලැබීමට නුසුදුසුකම් පිළිබඳ කිසියම් හේතු තිබේ නම් එම අත්හැර දැමීමේ ලියවිලි අයදුම්කරුවන්ට ලැබේද? නැතහොත් අත්හැර දැමීමේ අයදුම්පතක් සඳහා විශේෂ සැකසුම් ක්‍රමයක් තිබේද?

සංක්‍රමණ හා ජාතිකත්ව පනතේ විශේෂිත වශයෙන් දක්වා ඇති සංක්‍රමණ වීසා සඳහා වූ සියලු අයෝග්‍යතා හේතුවලට අයදුම්කරුවෝ යටත් වෙති. පනතේ සාමාන්‍යයෙන් දක්වා ඇති හේතු හැර වෙනත් වීසා ලැබීම අත්හැර දැමීමේ හේතු සඳහා විශේෂ ප්‍රතිපාදන නැත. අත්හැර දැමීම් පිළිබඳ ඉල්ලීම් සඳහා විශේෂ පිරිසැකසුමක් ද නැත. ඇමරිකන් ජාතිකයන් හෝ නීත්‍යානුකූල ස්ථිර පදිංචිකරුවන් හෝ ළඟ නැයන් වන අයට බලපාන පොදු අත්හැර දැමීමේ ප්‍රතිපාදන, විවිධත්ව වීසා අයදුම්කරුවන්ටද අදාල විය හැකි වුවද මෙම DV වැඩසටහනේ කාලසීමාවන් නිසා ඒවායින් ප්‍රයෝජන ගැනීම අයැදුම්කරුවන්ට දුෂ්කර විය හැකිය.

24. වෙනත් වර්ගයක සංක්‍රමණ වීසාවක් සඳහා දැනටමත් ලියාපදිංචි වී ඇති පුද්ගලයන්ට DV වැඩසටහනට අයදුම් කළ හැකිද?

එසේය. එබඳු පුද්ගලයන්ට DV වැඩසටහනට අයැදුම් කළ හැකිය.

25. තෝරා ගනු ලැබූ අයදුම්කරුවන්ට DV වර්ගයේ වීසා සඳහා අයැදුම් කිරීමට වලංගු කාලය කොපමණද?

DV -2014 වැඩසටහන යටතේ තෝරා ගනු ලැබූ පුද්ගලයන්ට වීසා අයැදුම් කිරීම සඳහා හිමිකම් ඇත්තේ එක්සත් ජනපද රජයේ 2014 මුදල් වර්ෂයේ, එනම් 2013 ඔක්තෝබර් 1 වැනි දින සිට 2014 සැප්තැම්බර් 30 වැනි දින දක්වාය. **අයැදුම්කරුවන් DV වීසා ලබා ගැනීම හෝ තත්වය වෙනස් කර ගැනීම මුදල් වර්ෂය අවසන් වන විට සිදු කොට තිබිය යුතුය.** තෝරා ගනු ලැබූ නමුත් 2014 සැප්තැම්බර් 30 වන විට (මුදල් වර්ෂය අවසානයේ) වීසා ලබා නොගත් පුද්ගලයන් සඳහා DV ප්‍රතිලාභ ඊළඟ වර්ෂයට ගෙනයාමට ඉඩක් නැත. තවද, DV-2014 ලියාපදිංචියකින් තත්වය ලබා ගන්නා කලත්‍රයන්ට හා දරුවන්ට DV වර්ගයේ වීසා ලබා ගත හැක්කේ 2013 ඔක්තෝබර් 1 වැනිදා සහ 2014 සැප්තැම්බර් 30 අතර කාලයේදී පමණි. පිටරටවල සිට අයදුම් කරන අයදුම්කරුවන්ට, නියම කළ සම්මුඛ සාකච්ඡාවට සති හතරේ සිට හය දක්වා වූ කලකට පෙර, (www.dvlottery.state.gov) වෙබ් අඩවියේ ප්‍රවේශ තත්ව පරීක්ෂාව තුලින් දැන්වීමක් ලැබේ.

26. E-DV සඳහා තෝරා ගනු ලැබුවෙකු මියගිය හොත් DV ගොනුවට කුමක් සිදුවේද?

තෝරා ගනු ලැබූ පුද්ගලයකුගේ මරණය නිසා DV ගොනුව ඉබේම අවලංගුවේ. සුදුසුකම් ලැබූ කලත්‍රයා සහ / හෝ දරුවෝ එම තේරීම යටතේ DV වීසා සඳහා තවදුරටත් හිමිකම් නොලබති.

27. E-DV අන්තර්ජාල සැබැඳියක් ලබාගත හැක්කේ කවදාද?

සබැඳි අයදුම්පතක් ලබාගත හැක්කේ 2012 ඔක්තෝබර් 02 වැනි අඟහරුවාදා EDT (GMT-4) මධ්‍යාහ්නයේ සිට 2012 නොවැම්බර් 03 වැනි සෙනසුරාදා EDT (GMT-4) මධ්‍යාහ්නයෙන් අවසන් වන ලියාපදිංචි කිරීමේ කාලපරිච්ඡේදය තුළදීය.

28. E-DV අයදුම්පත් ආකෘතිය Microsoft Word වැඩසටහනකට (නැතහොත් වෙනත් සුදුසු වැඩසටහනකට) පිටපත් කොට පිරවිය හැකිද?

නැත. පසුව සම්පූර්ණ කොට ඉදිරිපත් කිරීම සඳහා වෙනත් වැඩසටහනක සුරකිය නොහැකිය. E-DV අයදුම් පෝරමය, වෙබ් පෝරමයක් පමණි. මේ නිසා මෙය වෙළඳ නාමයකින් හැඳින්වෙන පද සකසනයකට වඩා ''සාර්වත්‍රිකය'' ය. තවද, සබැඳිව තිබියදී තොරතුරු පුරවා ඉදිරිපත් කිරීම මෙහිදි අපේක්ෂා කෙරේ.

29. මට ස්කෑනරයක් නැත්නම් එක්සත් ජනපදයේ සිටින මගේ ඥාතියකුට ඡායාරූප යවා, ඒවා ස්කෑන් කොට, ඩිස්කටයකට ඇතුල්කොට, අයදුම් කිරීම සඳහා එම ඩිස්කටය ආපසු මා වෙත ගෙන්වාගෙන ඉල්ලුම් කළ හැකිද?

එසේය. උපදෙස්වල දී ඇති ඡායාරූප අවශ්‍යතා සපුරාලන්නේනම් හා E-DV සබැඳි අයැදුම්පත්‍රය සමග ඡායාරූපද ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් ඉදිරිපත් කරන්නේ නම් මෙය කළ හැකිය. සබැඳි අයදුම්පතක් ඉදිරිපත් කරන අවස්ථාවේ අයදුම්කරුවන් ළඟ ස්කෑන් කරන ලද ඡායාරූප ගොනුවක් ද තිබිය යුතුය. ඡායාරූපය සහ අයදුම්පත වෙන වෙනම ඉදිරිපත් කළ නොහැක. එක් පුද්ගලයෙක් සඳහා ඉදිරිපත් කළ හැක්කේ එක් සබැඳි අයැදුම්පත්‍රයක් පමණි. බහු අයැදුම්පත්‍ර ඉදිරිපත් කිරීම නිසා එම පුද්ගලයා DV-2014 සඳහා නුසුදුස්සෙකු වනු ඇත. අයැදුම්පත (ඡායාරූපය හා අයදුම්පත) එක්සත් ජනපදයෙන් හෝ පිටරටකින් ඉදිරිපත් කළ හැකිය.

30. **සබැඳි පෝරමය සුරැකුම් කොට තබා ගෙන එක් කොටසක් පුරවා පසුව පැමිණ ඉතිරි කොටස සම්පූර්ණ කළ හැකිද?**

නැත, මෙය කළ නොහැකිය E-DV අයදුම් පත්‍රය සැලසුම් කර ඇත්තේ එක් විටකදී සම්පූර්ණ කොට ඉදිරිපත් කිරීම සඳහාය. කෙසේ වුවද, පෝරමය කොටස් දෙකකින් යුක්ත බැවින්, සම්භාවී ජාල බාධක හා ප්‍රමාද සිදුවිය හැකි නිසා E-DV පද්ධතිය සැලසුම් කර ඇත්තේ සබැඳි අයැදුම්පත බා ගැනීමත්, E-DV වෙබ් අඩවියට අයැදුම්පත්‍රය ලැබෙන අවස්ථාවත් අතර මිනිත්තු හැටකට (60) ඉඩ ලැබෙන අයුරිනි. මිනිත්තු හැටකට පසු අයැදුම් පත්‍රය ඉලෙක්ට්‍රොනිකව නොලැබුණහොත් ඒ වන විටත් ලැබී තිබුණු තොරතුරු ඉවතලනු ලැබේ. මෙසේ කෙරෙන්නේ, සම්පූර්ණ අයදුම්පතක්, පෙර ලැබුණු අර්ධ අයදුම්පතක පිටපතක් ලෙස අහම්බෙන් අර්ථ දැක්වීමට හැකියාවක් නැති කිරීමටයි. පෝරමය පිරවීමට අවශ්‍ය වන්නේ කවර තොරතුරද යන්න පැහැදිලිව හා සම්පූර්ණ ලෙස DV-2014 උපදෙස් වලින් විස්තර වේ. සබැඳි පෝරමය සම්පූර්ණ කිරීම ආරම්භ කිරීමට පෙර අවශ්‍ය සෑම තොරතුරක්ම ඔබට ඇතැයි සහතික කරගෙන, මැනවින් සූදානම්ව, එය ආරම්භ කළ යුතුය.

31. **යම් හෙයකින්, ඉදිරිපත් කරන ලද ඩිජිටල් ප්‍රතිබිම්බය පිරිවිතරට අනුකූල නොවන්නේ නම් E-DV අයදුම් පත්‍රය ඉබේම පද්ධතිය විසින් ප්‍රතික්ෂේප කෙරෙන බව ක්‍රියාපටිපාටි වලින් කියැවෙන අතර යවන්නාට ඒ බව දන්වනු ලැබේ. මෙයින් අදහස් වන්නේ මට අයදුම්පත නැවත ඉදිරිපත් කළහැකි බවද?**

එසේය, අයැදුම්පත්‍රය ඉබේම ප්‍රතික්ෂේප වී ඇති බැවින්, එය ඇත්ත වශයෙන්ම E-DV වෙබ් අඩවියට ඉදිරිපත් වී නැති ලෙස සලකනු ලැබේ. එම නිසා අයැදුම්පත්‍රය නැවත ඉදිරිපත් කළ හැකියි. එය ඉදිරිපත් E-DV අයැදුම්පත්‍රයක් සේ ගණන් නොගැනේ. ඒ නිසා තහවුරු දැන්වීමක් එවනු නොලැබේ. එවන ලද ඩිජිටල් ඡායාරූපය පිළිබඳව ගැටළු ඇත්නම්, අවශ්‍යතාවන්ට එය අනුකූල නොවන බැවින් එය E-DV වෙබ් අඩවිය විසින් ඉබේම ප්‍රතික්ෂේප කෙරේ. කෙසේ වෙතත් ප්‍රතික්ෂේප කිරීමේ පණිවුඩය යවන්නා වෙත පැමිණීමට ගතවන කාලය අන්තර්ජාලයේ ස්වභාවය අනුව කලින් ප්‍රකාශකළ නොහැකිය. අයදුම්කරුට ගැටළුව විසඳා ගැනීමට හැකිනම් හා පෝරමයේ පළමුවැනි හා දෙවැනි කොටස් විනාඩි හැටක් (60) තුළ නැවත එවිය හැකි නම් ගැටළුවක් ඇතිවන්නේ නැත. එසේ නොවුවහොත් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය නැවත පටන් ගත යුතුය. සම්පූර්ණ අයදුම්පත ලැබෙන තුරු හා තහවුරු කිරීමේ දැන්වීම එවන තුරු, අවශ්‍ය ඕනෑ තරම් වාරයක් අයැදුම්පතක් ඉදිරිපත් කිරීමට අයැදුම්කරුවෙකුට උත්සාහ කළ හැකිය.

32. **සබැඳි පද්ධතිය හරහා සම්පූර්ණ කරන ලද E-DV අයදුම්පත්‍රය බාරගන්නා ලද බවට එවන ඉලෙක්ට්‍රොනික තහවුරු කිරීමේ දැන්වීම එය ඉදිරිපත් කළ වහාම එවනු ලබන්නේද?**

පිළිගතහැකි E-DV අයදුම්පතක් ලැබුණු බවට තහවුරුව ඇතුළත් ප්‍රතිචාරය E-DV වෙබ් අඩවියෙන් වහාම යවනු ලැබේ. කෙසේ වුවත්, යවන්නාට ප්‍රතිචාරය ලැබෙන්නට කොපමණ කලක් ගතවේද යන්න අන්තර් ජලයේ හා ඉ-තැපැල් පද්ධතිවල ස්වභාවය අනුව කලින් ප්‍රකාශ කළ නොහැකිය. ''ඉදිරිපත් කරන්න'' බොත්තම ඔබා විනාඩි ගණනක් ගෙවී ගියහොත් ''ඉදිරිපත් කරන්න'' බොත්තම දෙවැනි වරටත් එබීමෙහි වරදක් නැත. දෙවැනි වරටත් ''ඉදිරිපත් කරන්න'' බොත්තම එබූ අවස්ථාවක E-DV වෙබ් අඩවියේ අවුලක් වන්නේ නැත. එයට හේතුව තහවුරු ප්‍රතිචාරය නිකුත් වී නොතිබීමයි. සම්පූර්ණ අයදුම්පත ලැබෙන තුරු හා තහවුරු කිරීම් දැන්වීම එවන තුරු ඕනෑ තරම් වාරයක් අයැදුම් පතක් ඉදිරිපත් කිරීමට අයැදුම්කරුවකුට උත්සාහ කළ හැකිය. **කෙසේ වෙතත් ඔබට තහවුරු කිරීමේ දැන්වීම ලැබීමෙන් පසු ඔබේ තොරතුරු නැවත ඉදිරිපත් නොකළ යුතුය.**

33. **අන්තර්ජාල වංචා හෝ ඉබේ ලැබෙන ඉ-තැපැල් පිළිබඳව මා පැමිණිලි කරන්නේ කෙසේද?**

අන්තර්ජාල වංචා පිළිබඳව පැමිණිල්ලක් ගොනු කිරීමට ඔබ අදහස් කරන්නේ නම්, කරුණාකර පෙඩරල් වෙළඳ කොමිෂන් සභාව විසින් පවත්වා ගෙන යන econsumer.gov.website බලන්න. http://www.econsummer.gov/english මෙය ජාතීන් 17 ක පාරිභෝගික ආරක්ෂක නියෝජ්‍ය ආයතන වල හවුල් ප්‍රයත්නයකි. නැතහොත් පෙඩරල් බියුරෝ ඔෆ් ඉන්වෙස්ටිගේෂන් (FBI) Internet Crime Complaint Center වෙත යන්න. අනවශ්‍ය ඉ-තැපෑල පිළිබඳව පැමිණිල්ලක් ගොනු කිරීමට Department of Justice Contact Us page වෙත යන්න.

34. **DV වැඩසටහන මඟින් වීසාවක් ලබා ගැනීමට මා සුදුසුකම් ලැබුවහොත් එක්සත් ජනපදයට යාමට එක්සත් ජනපද රජය ගුවන් ගමන් ගාස්තු ලබා දෙන්නේද? නිවාස හා රැකියාවක් ලබා ගැනීමට සහාය වන්නේද? මා ස්ථාවර තත්වයකට පත්වන තෙක් සෞඛ්‍ය පහසුකම් සහ අවශ්‍ය වෙනත් සහනාධාර ලබා දෙන්නේද?**

නැත. DV වීසාව ලැබූ අයැදුම්කරුවන්ට ගුවන් ගමන් ගාස්තු, නිවාස පහසුකම් හෝ අනෙකුත් අවශ්‍යතාවන් ආදී කිසිම ආකාරයක සහනාධාරයක් සපයන්නේ නැත. DV වීසාවක් සඳහා අයැදුම් කිරීමට ඔබ තේරී ඇත්නම්, ඔබට වීසාවක් නිකුත් කිරීමට පෙර, ඔබ එක්සත් ජනපද රජයට බරක් නොවන බවට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. ඒවා නම් ඔබේ පුද්ගලික වත්කම්, එක්සත් ජනපදයේ පදිංචි වී සිටින ඥාතියකුගෙන් හෝ මිතුරකුගෙන් ලබාගත් (I-134 පෝරමය) දිවුරුම් ප්‍රකාශයක් සහ/හෝ එක්සත් ජනපදයේ සේවා යෝජකයකුගෙන් රැකියාවක් පිරිනමන බවට සහතිකයක් යන මේවායේ එකතුවක් විය යුතුය.

DV – 2014 සඳහා සුදුසුකම් ලබන ස්වදේශිකයන් සිටින රටවල ලැයිස්තුව කලාප වශයෙන්

මෙම විවිධත්ව වැඩසටහන සඳහා එක් එක් භූගෝලීය ප්‍රදේශ තුළ DV-2014 සඳහා සුදුසුකම් ලබන ස්වදේශිකයන් සිටින රටවල් පහත සඳහන් ලැයිස්තුවෙන් පෙන්නුම් කෙරේ. යටත් ප්‍රදේශ, පාලක රටෙහි ප්‍රදේශය තුළ ඇතුළත් කෙරේ. DV-2014 වැඩසටහන සඳහා සුදුසුකම් නොලබන ස්වදේශිකයන් සිටින රටවල්, සංක්‍රමණ හා ජාතිකත්ව පනතේ 203 (ඇ) වගන්තියෙහි සූත්‍රයට අනුව එක්සත් ජනපද පුරවැසි හා සංක්‍රමණ සේවා (USCIS) විසින් හඳුනාගෙන ඇත. මෙම විවිධත්ව වැඩසටහන සඳහා සුදුසුකම් නොලබන රටවල් (ඒවා පවුල් අනුග්‍රහය ලබන සහ රැකියා පදනම් වූ සංක්‍රමණය හෝ ඉහළ ඇතුල් වීමක් ඇති රටවල් නිසාය) අදාළ ප්‍රාදේශීය ලැයිස්තුවලට පසුව සඳහන් කෙරේ

<u>අප්‍රිකාව</u>

ඇල්ජීරියාව
ඇංගෝලාව
බෙනින්
බොට්ස්වානා
බුර්කිනා ෆසෝ
බුරුන්ඩි
කැමරූන්
කේප්වර්ඩ්
මධ්‍යම අප්‍රිකානු සමූහාණ්ඩුව
චැඩ්
කොමොරොස්
කොංගෝව
කොංගෝ ප්‍රජාතාන්ත්‍රික සමූහාණ්ඩුව
කෝට් ඩි අයිවොරි (අයිවරිකෝස්ට්)
ජිබුටි
ඊජිප්තුව
නිරක්ෂීය ගිනි
එරත්‍රියාව
ඉතියෝපියාව
ගැබොන්
ගැම්බියාව
ඝානාව
ගිනියාව
ගිනි-බිසව්
කෙන්යාව
ලෙසොතෝ
ලයිබීරියාව
ලිබියාව
මැඩගස්කරය
මලාවි
මාලි
මොරිටේනියාව
මොරීෂස්
මොරොක්කෝව
මොසැම්බික්
නැමීබියාව
නයිගර්
නයිජීරියාව
රුවන්ඩා
සා ඕ-ටොමේ සහ ප්‍රින්සිපෙ
සෙනෙගාලය
සීෂෙල්ස්
සියරා ලියොන්
සෝමාලියාව
දකුණු අප්‍රිකාව
දකුණු සුඩානය
සුඩානය
ස්වාසිලන්තය
ටැන්සානියාව
ටෝගෝ
ටියුනීසියාව
උගන්ඩාව
සැම්බියාව
සිම්බාබ්වේ

ගාසා තීරුවේ උපන් අයට අදාල රට වන්නේ ඊජිප්තුවයි. බටහිර ඉවුරේ උපන් අයට අදාළ රට ජෝර්දානය වන අතර ගොලාන් කඳුකරයේ උපන් අයට අදාළ රට වන්නේ සිරියාවයි.

DV – 2013 සඳහා සුදුසුකම් ලබන ස්වදේශිකයන් සිටින රටවල් ලැයිස්තුව කලාප වශයෙන්

ආසියාව

ඇෆ්ගනිස්තානය
බහරේන්
භූතානය
බෘනායි
බුරුමය
කාම්බෝජය
හොංකොං විශේෂ පරිපාලන ප්‍රදේශය
ඉන්දුනීසියාව
ඉරානය
ඉරාකය
ඊශ්‍රායලය
ජපානය
ජෝර්දානය
කුවයිට්
ලා ඕසය
ලෙබනනය
මැලේසියාව
මාලදිවයින
මොංගෝලියාව
නේපාලය
උතුරු කොරියාව
ඕමානය
ක්ටාර්
සෞදි අරාබිය
සිංගප්පූරුව
ශ්‍රී ලංකාව
සිරියාව
තායිවානය
තායිලන්තය
ටිමෝර්-ලෙස්ටි
එක්සත් අරාබි එමීර් රාජ්‍යය
යේමනය

පහත සඳහන් ආසියානු රටවල ස්වදේශිකයෝ මෙම වර්ෂයේ විවිධත්ව වැඩසටහන සඳහා සුදුසුකම් නොලබති: බංගලාදේශය, චීනය (ප්‍රධාන රටේ උපන්) ඉන්දියාව, පකිස්තානය, දකුණු කොරියාව, පිලිපීනය සහ වියට්නාමය. හොංකොං විශේෂ පරිපාලන ප්‍රදේශය, මැකාවු විශේෂ පරිපාලන ප්‍රදේශයද සහ තායිවානය සුදුසුකම් ලබන අතර ඉහළ ලැයිස්තුගත කර ඇත.

1967 ජූනි මාසයට පෙර ඊශ්‍රායලය, ජෝර්දානය හා සිරියාවෙන් පාලනය කරනු ලැබූ ප්‍රදේශ වල උපන් ජනයාට අදාල රට වන්නේ පිළිවෙලින් ඊශ්‍රායලය, ජෝර්දානය හා සිරියාවයි. ගාසා තීරුවේ උපන් අයට අදාල රට වන්නේ ඊජිප්තුවයි; බටහිර ඉවුරේ උපන් අයට අදාළ රට ජෝර්දානය වන අතර ගොලාන් කඳුකරයේ උපන් අයට අදාළ රට වන්නේ සිරියාවයි.

DV – 2013 සඳහා සුදුසුකම් ලබන ස්වදේශිකයන් සිටින රටවල්වල ලැයිස්තුව කලාප වශයෙන්

<u>යුරෝපය</u>

ඇල්බේනියාව
ඇන්ඩෝරාව
ආර්මීනියාව
ඕස්ට්‍රියාව
අසර්බයිජානය
බෙලාරුස්
බෙල්ජියම
බොස්නියා සහ හර්සෙගෝවිනා
බල්ගේරියාව
ක්‍රොඒෂියා
සයිප්‍රස්
චෙක් සමූහාණ්ඩුව
ඩෙන්මාර්ක් (සංරචක සහ
විදේශ යටත් ප්‍රදේශ ඇතුළුව)
එස්තෝනියාව
පින්ලන්තය
ප්‍රංශය (සංරචක සහ
විදේශ යටත් ප්‍රදේශ ඇතුළුව)
ජෝර්ජියාව
ජර්මනිය
ග්‍රීසිය
හංගේරියාව
අයිස්ලන්තය
අයර්ලන්තය
ඉතාලිය
කසක්ස්තාන්
කොසෝවෝ
කිර්ගිස්තාන්
ලැට්වියා
ලීචෙන්ස්ටෙන්
ලිතුවේනියාව
ලක්සම්බර්ග්
මැකාවු විශේෂ පරිපාලන ප්‍රදේශය
මැසිඩෝනියාව
මෝල්ටාව
මෝල්ඩෝව
මොනාකෝ
මොන්ටිනීග්‍රෝ
නෙදර්ලන්තය (සංරචක සහ යටත් ප්‍රදේශ ඇතුළුව)
උතුරු අයර්ලන්තය
නෝර්වේ
පෝලන්තය
පෘතුගාලය (සංරචක සහ විදේශ යටත් ප්‍රදේශ ඇතුළුව)
රොමේනියාව
රුසියාව
සැන්මැරිනෝ
සර්බියාව
ස්ලෝවැකියාව
ස්ලෝවේනියාව
ස්පාඤ්ඤය
ස්වීඩනය
ස්විට්සර්ලන්තය
තජිකිස්තාන්
තුර්කිය
ටර්ක්මෙනිස්තාන්
උක්රේනය
උස්බෙකිස්තානය
වතිකානු නගරය

පහත දැක්වෙන යුරෝපීය රටවල ස්වදේශිකයන් මෙම වර්ෂයේ විවිධත්ව වැඩසටහන සඳහා සුදුසුකම් නොලබති. 1. මහා ාතාන්‍යය (එක්සත් රාජධානිය) මහා ාතාන්‍යයට (එක්සත් රාජධානිය) පහත සඳහන් යටත් ප්‍රදේශ ඇතුලත් වේ : ඇංගිලා, බර්මුඩා, ාතාන්‍ය වර්ජීන් දූපත්, කේමන් දූපත්, ෆොක්ලන්ඩ් දූපත්, ජීබ්‍රෝල්ටා, මොන්සෙරාට්, පිටිකයින්, සාන්ත හෙලේනා, ටර්කස් සහ කයිකෝස් දූපත්. විවිධත්ව වැඩසටහන සඳහා පමණක්, උතුරු අයර්ලන්තය වෙනම සලකනු ලැබෙන බවද, උතුරු අයර්ලන්තය සුදුසුකම් ලබන බවත් එය සුදුසුකම් ලබන ප්‍රදේශ අතර ලැයිස්තු ගත කර ඇති බව ද සළකන්න මකාවු විශේෂ පරිපාලන ප්‍රදේශයද සුදුසුකම් ලබන අතර එය ඉහත ලැයිස්තු ගතකර තිබේ..

DV – 2013 සඳහා සුදුසුකම් ලබන ස්වදේශිකයන් සිටින රටවල් ලැයිස්තුව කලාප වශයෙන්

උතුරු ඇමෙරිකාව

බහමාස්

උතුරු ඇමෙරිකාවේ, කැනඩාවේ සහ මැක්සිකෝවේ ස්වදේශිකයෝ මෙම වර්ෂයේ විවිධත්ව වැඩසටහනට සුදුසුකම් නොලබති.

ඕෂිනියාව

ඕස්ට්‍රේලියාව (සංරචක සහ පිටරට යටත් ප්‍රදේශ ඇතුළුව)	පලාවු
ෆිජී	පැපුවා නිව්ගිනියා
කිරිබටි	සොලමන් දූපත්
මාෂල් දූපත්	ටොංගා
මයික්‍රෝනීසියා ෆෙඩරල් රාජ්‍ය	ටුවාලූ
නාඋරු	වනුඅටු
නිව්සීලන්තය (සංචරක සහ පිටරට යටත් ප්‍රදේශ ඇතුළුව)	සැමොවා

දකුණු ඇමරිකාව, මධ්‍යම ඇමරිකාව සහ කැරිබියන් දූපත්

ඇන්ටිගුආ සහ බාබුඩා	ගුයනා
ආජෙන්ටිනාව	හොන්ඩියුරාස්
බාබඩෝස්	නිකරගුආ
බෙලිසි	පැනමා
බොලිවියා	පැරගුවේ
චිලී	සැන්ට් කිට්ස් සහ නේවිස්
කොස්ටාරිකා	සැන්ට් ලූසියා
කියුබා	සැන්ට් වින්සන්ට් සහ ග්‍රැනඩයින්ස්
ඩොමිනිකා	සුරිනාම්
ග්‍රැනඩා	ට්‍රිනිඩෑඩ් සහ ටොබාගෝ
ගෝතමාලාව	උරුගුවේ
	වෙනිසියුලාව

මේ වර්ෂයෙහි විවිධත්ව වැඩසටහන සඳහා ස්වදේශිකයන් සුදුසුකම් නොලබන මෙම කලාපයේ රටවල් : බ්‍රසීලය, කොලොම්බියාව, ඩොමිනිකන් සමූහාණ්ඩුව, ඉක්වදෝරය, එල්සැල්වදෝරය, හයිටි, ජැමෙයිකාව, මැක්සිකෝව සහ පේරු.